# ආර්ථික විද්‍යාව

## විෂය නිර්දේශය

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ

# 12 සහ 13 ශ්‍රේණි

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

වාණිජ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
www.nie.lk

ආර්ථික විද්‍යාව
12 සහ 13 ශ්‍රේණි - විෂය නිර්දේශය

© ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රථම මුද්‍රණය - 2017

ISBN :

වාණිජ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය :

| | පටුන | පිටුව |
|---|---|---|
| 1.0 | හැඳින්වීම | ii |
| 2.0 | ජාතික පොදු අරමුණු | iii |
| 3.0 | පොදු නිපුණතා සමූහ | iv - v |
| 4.0 | විෂය නිර්දේශයේ අරමුණු | vi |
| 5.0 | ජාතික පොදු අරමුණු හා විෂය නිර්දේශයේ අරමුණු අතර සම්බන්ධතාව | vii |
| 6.0 | විෂය නිර්දේශය | viii - ix |
| | 6.1 12 ශ්‍රේණිය විෂය නිර්දේශය | 1 - 34 |
| | 6.2 13 ශ්‍රේණිය විෂය නිර්දේශය | 35 - 65 |
| 7.0 | පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් | 66 - 67 |
| 8.0 | තක්සේරුව හා ඇගැයීම | 67 |

# 1.0 හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා මුල් වරට නිපුණතා පාදක විෂය නිර්දේශයක් 2009 වර්ෂයේ දී පාසල් පද්ධතියට හඳුන්වා දෙන ලදි. ආර්ථික විද්‍යාව විෂය පථය තුළ පවතින සූක්ෂම ආර්ථික විද්‍යාව, සාර්ව ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව හා සංවර්ධන ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රවල ඇති වී ඇති කාලීන වෙනස් වීම් හා ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් 2017 වර්ෂයේ සිට අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ආර්ථික විද්‍යාව විෂය නිර්දේශය නිපුණතා පාදක ව නවීකරණය කර ඉදිරිපත් කිරීම සිදු කෙරේ.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) කලා, වාණිජ හා තාක්ෂණික විෂය ධාරාවලට අයත් ඉතා වැදගත්, ප්‍රයෝජනවත් හා ජනප්‍රිය විෂයයක් වන ආර්ථික විද්‍යාව විෂය හදාරන ශිෂ්‍යයන් අදාළ විෂය දැනුමෙන් පමණක් නොව, යහපත් ආකල්ප හා ප්‍රායෝගික කුසලතාවලින් හෙබි තාර්කික පුරවැසියන් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ඵලදායිව හා කාර්යක්ෂම ව දායක වේ යැයි ආපේක්ෂා කෙරේ.

ආර්ථික විද්‍යාව එදිනෙදා මිනිස් ජීවිතයට ඉතාමත් සමීප සමාජීය විද්‍යාවකි. මිනිසා සමාජයේ හැසිරෙන ආකාරය විවිධ දෘෂ්ටි කෝණවලින් අධ්‍යයනය කිරීම සමාජීය විද්‍යාව මඟින් සිදු කරන අතර, මිනිසාට සමාජයේ හැසිරෙන ආකාරය ආර්ථික දෘෂ්ටි කෝණයෙන් දැකීම හා අධ්‍යයනය කිරීම ආර්ථික විද්‍යාව විෂය තුළින් සිදු කෙරේ. මේ නිසා සමාජයේ ජීවත් වීමේ දී තාර්කික පුරවැසියකු ලෙස එදිනෙදා කටයුතු කිරීමට හා තීරණ ගැනීම සඳහා හොඳ පදනමක් ආර්ථික විද්‍යාව විෂයයෙන් සපයනු ලැබේ.

වාණිජ්‍යය, කළමනාකරණය හා ගිණුම්කරණය යන විෂයයන්වලට පදනම වී ඇත්තේ ද ආර්ථික විද්‍යාව විෂයයි. මේ නිසා වාණිජ්‍යය, කළමනාකරණය හා ගිණුම්කරණ උපාධි පාඨමාලාවලට හා වෘත්තීය පාඨමාලාවට ද ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් කර ඇත. එහෙයින් මෙම විෂය හදාරන ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අවස්ථා ද සුලබ වේ.

ආර්ථික විද්‍යාව එදිනෙදා මිනිස් ජීවිතයට සමීප ප්‍රායෝගික විෂයයක් බැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය සැලසුම් කිරීමේ දී පන්ති කාමරය තුළ මෙන් ම එයින් බාහිරව ද අත්දැකීම් ලබා දීම මගින් විෂය නිර්දේශයේ අරමුණු ළඟා කර ගැනීම සඳහා ශිෂ්‍යයන් මෙහෙයවීම වැදගත් වන අතර , ගුරුභවතුන් වශයෙන් ඔබගේ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය කටයුතු කර ගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

## 2.0 ජාතික පොදු අරමුණු

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාව (2003 දෙසැම්බර්)**

## 3.0 පොදු නිපුණතා සමූහ

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණය ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනය අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජීක, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවලට උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම

## 4.0 විෂය නිර්දේශයේ අරමුණු

- ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම
- සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳ ව විස්තරාත්මක අවබෝධයක් ලබා දීම
- ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න උපනති විශ්ලේෂණය කිරීම සහ සමාජයේ යහපැවැත්ම සඳහා කටයුතු කිරීමට පදනම ලබා දීම
- වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයින් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශනය කිරීමට පෙලඹවීම
- සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා විශ්ලේෂණය කිරීම
- සමකාලීන ආර්ථික ප්‍රතිපත්ති විග්‍රහ කිරීමේ හැකියාව ලබා දීම
- සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීම සඳහා රජය මැදිහත්වන ආකාරය පිළිබඳ ව විමසා බැලීමට යොමු කිරිම
- අන්තර්ජාතික වෙළෙඳාම, අන්තර් ජාතික මූල්‍ය හා ආර්ථික ඒකාබද්ධතාව අතර ඇති සබඳතාව විග්‍රහ කිරීමට යොමු කිරීම
- සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මක ව විමසීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම
- ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ ව විස්තරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම
- උසස් අධ්‍යාපනයට යොමු වීම උදෙසා ප්‍රවේශයක් ලබා දීම

## 5.0 ජාතික පොදු අරමුණු සහ විෂය නිර්දේශයේ අරමුණු අතර සම්බන්ධතාව

| විෂය නිර්දේශයේ අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| • ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම | | | | | ✓ | | ✓ | |
| • සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳ ව විස්තරාත්මක අවබෝධයක් ලබා දීම | ✓ | | ✓ | | | | | |
| • ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න උපනති විශ්ලේෂණය කිරීම සහ සමාජයේ යහපැවැත්ම සඳහා කටයුතු කිරීමට පදනම ලබා දීම | | ✓ | | ✓ | | | | |
| • වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයින් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශනය කිරීමට පෙලඹවීම | | | ✓ | | | | ✓ | |
| • සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ ඇසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා විශ්ලේෂණය කිරීම | | ✓ | | | | | | ✓ |
| • සමකාලීන ආර්ථික ප්‍රතිපත්ති විග්‍රහ කිරීමේ හැකියාව ලබා දීම | ✓ | | | | | | | ✓ |
| • සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීම සඳහා රජය මැදිහත්වන ආකාරය පිළිබඳ ව විමසා බැලීමට යොමු කිරිම | | | ✓ | | | ✓ | | |
| • අන්තර්ජාතික වෙළෙඳාම, අන්තර් ජාතික මූල්‍ය හා ආර්ථික ඒකාබද්ධතාව අතර ඇති සබඳතාව විග්‍රහ කිරීමට යොමු කිරීම | | | | | | | | ✓ |
| • සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම | | | | ✓ | | | ✓ | |
| • ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ ව විස්තරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම | | | | | ✓ | ✓ | | |
| • උසස් අධ්‍යාපනයට යොමු වීම සඳහා ප්‍රවේශයක් ලබා දීම | | | | | ✓ | ✓ | | |

# 6.0 විෂය නිර්දේශය

12 ශ්‍රේණිය

| නිපුණතාව | කාලච්ඡේද ගණන |
|---|---|
| 01 ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳා ගන්නා විකල්ප ක්‍රම තුලනාත්මක ව විග්‍රහ කරයි. | 50 |
| 02 ඉල්ලුම, සැපයුම, නම්‍යතාව හා වෙළෙඳපොළ සමතුලිතය විශ්ලේෂණය කරයි. | 80 |
| 03 වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි. | 30 |
| 04 වෙළෙඳපොළ තුළ නිෂ්පාදන ආයතන තාර්කිකව හැසිරෙන ආකාරය ගවේශනය කරයි. | 50 |
| 05 සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගනිමින් ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | 55 |
| 06 සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය විග්‍රහ කරයි. | 35 |
| | 300 |

13 ශ්‍රේණිය

| නිපුණතාව | කාලච්ඡේද ගණන |
|---|---|
| 07 මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායකවන ආකාරය විමර්ෂනය කරයි. | 60 |
| 08 සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීමෙහිලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි. | 65 |
| 09 විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේශණය කරයි. | 40 |
| 10 විදේශ මුල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි. | 45 |
| 11 සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි. | 70 |
| 12 ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය සහ ප්‍රතිපත්ති පිළිබඳ ව තුලනාත්මක ව විමර්ශනය කරයි. | 20 |
| | 300 |

## විෂය නිර්දේශය පාසල් වාර අනුව බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා හා නිපුණතා මට්ටම් | කාලච්ඡේද ගණන | නිපුණතා මට්ටම් ගණන |
|---|---|---|---|---|
| 12 වන ශ්‍රේණිය | පළමුවන වාරය | නිපුණතා මට්ටම 1.1 සිට නිපුණතා මට්ටම 2.8 දක්වා | 104 | (නිපුණතා මට්ටම් 17) |
| | දෙවන වාරය | නිපුණතා මට්ටම 2.9 සිට නිපුණතා මට්ටම 4.5 දක්වා | 98 | (නිපුණතා මට්ටම් 14) |
| | තුන්වන වාරය | නිපුණතා මට්ටම 4.6 සිට නිපුණතා මට්ටම 6.4 දක්වා | 98 | (නිපුණතා මට්ටම් 12) |
| 13 වන ශ්‍රේණිය | පළමුවන වාරය | නිපුණතා මට්ටම 7.1 සිට නිපුණතා මට්ටම 8.5 දක්වා | 101 | (නිපුණතා මට්ටම් 14) |
| | දෙවන වාරය | නිපුණතා මට්ටම 8.6 සිට නිපුණතා මට්ටම 10.7 දක්වා | 103 | (නිපුණතා මට්ටම් 15) |
| | තුන්වන වාරය | නිපුණතා මට්ටම 10.8 සිට නිපුණතා මට්ටම 12.3 දක්වා | 96 | (නිපුණතා මට්ටම් 13 ) |

## 6.1- 12 වන ශ්‍රේණිය විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01. ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න සහ ඒවා විසඳා ගන්නා විකල්ප ක්‍රම තුලනාත්මක ව විග්‍රහ කරයි. | | | | 50 |
| | 1.1 ආර්ථික විද්‍යාව පිළිබඳ පදනම පරීක්ෂා කරයි. | • මිනිසුන්ගේ ආර්ථික හැසිරීම<br>• සමාජීය විද්‍යාවක් ලෙස ආර්ථික විද්‍යාව<br>• ආර්ථික විද්‍යාව පිළිබඳ නිර්වචනය<br>• ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත්කම<br>• සූක්ෂ්ම හා සාර්ව ආර්ථික විද්‍යාව<br>• යථානුරූපී හා අභිමතානුරූපී ආර්ථික ප්‍රකාශ | • මිනිසුන්ගේ ආර්ථික හැසිරීම විස්තර කරයි.<br>• ආර්ථික විද්‍යාව සමාජීය විද්‍යාවක් බව තහවුරු කරයි.<br>• ආර්ථික විද්‍යාව නිර්වචනය කොට එහි විෂය ක්ෂේත්‍රය පැහැදිලි කරයි.<br>• ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• සූක්ෂ්ම හා සාර්ව ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍ර අතර වෙනස නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• ආර්ථික විද්‍යාවේ යථානුරූපී සහ අභිමතානුරූපී ප්‍රකාශ අතර වෙනස නිදසුන් මගින් පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.2 භාණ්ඩ හා සේවා පරිභෝජනයෙන් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් වන ආකාරය පෙන්වා දෙයි. | • මිනිස් අවශ්‍යතා හා වුවමනා<br>• භාණ්ඩ<br>  • ආර්ථික භාණ්ඩ<br>  • ආර්ථික නොවන භාණ්ඩ<br>• සම්පත්<br>  • ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත්<br>  • ප්‍රතිෂ්ඨාපනය කළ හැකි හා ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් | • මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර වෙනස නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩවල වෙනස නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• ආර්ථික නොවන භාණ්ඩ, ආර්ථික භාණ්ඩ බවට පත්වන ආකාරය පෙන්වා දෙයි.<br>• සම්පත්, ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් ලෙස වර්ග කරයි.<br>• ස්වභාවික සම්පත් ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් හා ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් ලෙස වර්ග කර නිදසුන් දක්වයි.<br>• ස්වභාවික සම්පත් රැකගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 නිෂ්පාදන සාධකවල ලක්ෂණ හඳුනා ගනිමින් නිෂ්පාදන සම්පත්වල ඵලදායිතාව තීරණය කරන සාධක විග්‍රහ කරයි. | • නිෂ්පාදන සාධක<br>• භූමිය<br>• ශ්‍රමය<br>• ප්‍රාග්ධනය<br>• ව්‍යවසායකත්වය<br><br>• නිෂ්පාදන සම්පත්වල ඵලදායිතාව<br>• අර්ථ දැක්වීම<br>• තීරක<br>• තාක්ෂණය<br>• මානව ප්‍රාග්ධනය<br>• කළමනාකරණය<br>• ශ්‍රම විභජනය<br>• විශේෂීකරණය | • භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා නිෂ්පාදන සාධක වර්ග කරයි.<br>• නිෂ්පාදන සාධකවල ලක්ෂණ වෙන් වෙන් ව දක්වයි.<br>• නිෂ්පාදන සම්පත්වල ඵලදායිතාව අර්ථ දක්වයි.<br>• නිෂ්පාදන සම්පත්වල ඵලදායිතාව තීරණය කරන සාධක විස්තර කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 ආර්ථිකයක කේන්ද්‍රීය ගැටලුව තාර්කික ව විශ්ලේෂණය කරයි. | • හිඟකම<br>• තෝරා ගැනීම<br>• ආවස්ථික පිරිවැය | • හිඟකම යන සංකල්පය නිර්වචනය කරයි.<br>• හිඟකමට හේතු ඉදිරිපත් කරයි.<br>• සම්පත්වල පවතින විකල්ප ප්‍රයෝජන පෙළගස්වා තෝරා ගැනීමෙහි යෙදෙන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරයි.<br>• ආවස්ථික පිරිවැය සංකල්පය අර්ථකථනය කරයි.<br>• ආවස්ථික පිරිවැය සංකල්පය නිදසුන් ඇසුරෙන් විශ්ලේෂණය කරයි.<br>• ආවස්ථික පිරිවැය ශූන්‍ය වන අවස්ථා නිදසුන් ඇසුරෙන් විශ්ලේෂණය කරයි.<br>• හිඟකම හා ආවස්ථික පිරිවැය අතර සම්බන්ධතාව විස්තර කරයි. | 06 |
| | 1.5 මූලික ආර්ථික ප්‍රශ්න විමසයි. | • මූලික ආර්ථික ප්‍රශ්න<br>• කුමක්, කොපමණ නිපදවිය යුතු ද ?<br>• කෙසේ නිපදවිය යුතු ද ?<br>• කා සඳහා නිපදවිය යුතු ද ? | • මූලික ආර්ථික ප්‍රශ්න නම් කරයි.<br>• කුමක්, කොපමණ නිපදවිය යුතු ද යන මූලික ආර්ථික ප්‍රශ්න විග්‍රහ කරයි.<br>• කෙසේ නිපදවිය යුතු ද යන මූලික ආර්ථික ප්‍රශ්නය විග්‍රහ කරයි.<br>• කා සඳහා නිපදවිය යුතු ද යන මූලික ආර්ථික ප්‍රශ්නය විග්‍රහ කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.6 මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සංවිධානය වන ආකාරය විශ්ලේෂණය කරයි. | • ආර්ථික පද්ධති<br>• අර්ථ දැක්වීම<br>• මූලිකාංග<br>• තීරණ ගන්නා පාර්ශ්ව | • ආර්ථික පද්ධති අර්ථ දක්වයි.<br>• ආර්ථික පද්ධතියක මූලිකාංග පැහැදිලි කරයි.<br>• ආර්ථික පද්ධතියක තීරණ ගන්නා පාර්ශ්ව නම් කරයි.<br>• ආර්ථික පද්ධතියක තීරණ ගන්නා පාර්ශ්වවල කාර්යභාරය විමසයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.7 විවිධ නිර්ණායක භාවිත කරමින් ආර්ථික පද්ධති වර්ග කරයි. | • ආර්ථික පද්ධති වර්ග කිරීමේ නිර්ණායක<br>• ආර්ථික පද්ධති වර්ගීකරණය<br>  • වෙළෙඳපොළ ආර්ථික පද්ධති<br>  • විධාන ආර්ථික පද්ධති<br>  • මිශ්‍ර ආර්ථික පද්ධති<br>• ආර්ථික පද්ධති සම්බන්ධ නව ප්‍රවණතා<br>• ආර්ථික පද්ධතියක කාර්ය සාධනය මිනුම් කිරීමේ නිර්ණායක | • ආර්ථික පද්ධති වර්ග කිරීම සඳහා භාවිත කරන නිර්ණායක විස්තර කරයි.<br>• වෙළෙඳපොළ ආර්ථික පද්ධති අර්ථ දක්වයි.<br>• වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක ලක්ෂණ හා ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි.<br>• වෙළඳපොළ ආර්ථික පද්ධති මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය විග්‍රහ කරයි.<br>• විධාන ආර්ථික පද්ධති අර්ථ දක්වයි.<br>• විධාන ආර්ථික පද්ධතියක ලක්ෂණ හා ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි.<br>• විධාන ආර්ථික පද්ධති මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය විග්‍රහ කරයි.<br>• මිශ්‍ර ආර්ථික පද්ධති අර්ථ දක්වයි.<br>• මිශ්‍ර ආර්ථික පද්ධතියක ලක්ෂණ හා ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි.<br>• මිශ්‍ර ආර්ථික පද්ධති මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය විග්‍රහ කරයි.<br>• ආර්ථික පද්ධති සම්බන්ධ නව ප්‍රවණතා විමසා බලයි.<br>• ආර්ථික පද්ධතියක කාර්ය සාධනය මිනුම් කිරීමේ නිර්ණායක පෙළ ගස්වයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.8 නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ඇසුරෙන් ආවස්ථික පිරිවැය හැසිරෙන ආකාරය විශ්ලේෂණය කරයි. | • නිෂ්පාදන හැකියා මායිම<br>• අර්ථ දැක්වීම<br>• උපකල්පන<br>• ආවස්ථික පිරිවැය (වගු හා ප්‍රස්තාර මගින් )<br>• ස්ථාවර ආවස්ථික පිරිවැය<br>• වැඩෙන ආවස්ථික පිරිවැය | • නිෂ්පාදන හැකියා මායිම අර්ථ දක්වයි.<br>• නිෂ්පාදන හැකියා මායිම නිර්මාණය කිරීමේ දී යොදා ගනු ලබන උපකල්පන නම් කරයි.<br>• ස්ථාවර හා වැඩෙන ආවස්ථික පිරිවැය තත්ත්ව යටතේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර නිර්මාණය කරයි.<br>• නිෂ්පාදන හැකියා මායිම භාවිත කරමින් ආවස්ථික පිරිවැයේ හැසිරීම විග්‍රහ කරයි.<br>• ස්ථාවර හා වැඩෙන ආවස්ථික පිරිවැය තත්ත්වයන්ට බලපාන සාධක ඉදිරිපත් කරයි.<br>• වැඩෙන ආවස්ථික පිරිවැය වඩාත් තාත්වික තත්ත්වයක් බව තහවුරු කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.9 ආර්ථික විද්‍යාවේ මූලික සංකල්ප සහ නිෂ්පාදන ධාරිතාව වෙනස්වීම් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇසුරෙන් නිරූපණය කරයි. | • සූක්ෂ්ම ආර්ථික විද්‍යා සංකල්ප සහ සාර්ව ආර්ථික විද්‍යා සංකල්ප නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ඇසුරෙන් ඉදිරිපත් කිරීම<br>• හිඟකම<br>• නිෂ්පාදන කාර්යක්ෂමතාව<br>• ඌන උපයෝජනය<br>• සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාව<br>• ආර්ථික පසුබැසීම<br>• වර්තමාන පරිභෝජනය හා අනාගත පරිභෝජනය අතර සම්පත් බෙදාහැරීම<br>• නිෂ්පාදන ධාරිතාව වෙනස්වීම<br>• ආර්ථික බිඳ වැටීම<br>• සාධකවල ඵලදායිතාව වෙනස් වීම<br>• ආර්ථික වෘද්ධිය | • සූක්ෂ්ම ආර්ථික විද්‍යා සංකල්ප නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ඇසුරෙන් ඉදිරිපත් කරයි.<br>• සාර්ව ආර්ථික විද්‍යා සංකල්ප නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇසුරෙන් පෙන්වයි.<br>• නිෂ්පාදන ධාරිතාව වෙනස් වීමට බලපාන සාධක අනුව නිෂ්පාදන ධාරිතාව වෙනස් වන ආකාරය නිෂ්පාදන හැකියා මායිමකින් පෙන්වයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2 ඉල්ලුම, සැපයුම නම්‍යතාව හා වෙළෙඳපොළ සමතුලිතය විශ්ලේෂණය කරයි. | 2.1 ඉල්ලුම් තීරක ඇසුරෙන් ඉල්ලුම් න්‍යාය හා ඉල්ලුම් නීතිය විග්‍රහ කරයි. | • ඉල්ලුම<br>  • අර්ථ දැක්වීම<br>  • පෞද්ගලික ඉල්ලුම හා වෙළෙඳපොළ ඉල්ලුම<br>  • ඉල්ලුම තීරණය කරන සාධක<br>  • ඉල්ලුම් න්‍යාය (ශ්‍රිතය)<br>• ඉල්ලුම් නීතිය<br>• ඉල්ලුම් නීතිය ඉදිරිපත් කරන ක්‍රම<br>  • ඉල්ලුම් ලේඛනය<br>  • ඉල්ලුම් වක්‍රය<br>  • ඉල්ලුම් සමීකරණය<br>• ඉල්ලුම් නීතියට හේතු<br>  • මිල ප්‍රතිවිපාකය<br>    • ආදායම් ප්‍රතිවිපාකය<br>    • ආදේශන ප්‍රතිවිපාකය<br>• ඉල්ලුම් නීතියට පටහැනි අවස්ථා<br>  • ගිෆන් භාණ්ඩ<br>  • ප්‍රදර්ශනාත්මක භාණ්ඩ | • ඉල්ලුම නිර්වචනය කරයි.<br>• පෞද්ගලික ඉල්ලුම හා වෙළෙඳපොළ ඉල්ලුම අතර වෙනස පැහැදිලි කරයි.<br>• ඉල්ලුම කෙරෙහි බලපාන සාධක නම් කරයි.<br>• ඉල්ලුම කෙරෙහි බලපාන එක් එක් සාධකය ඉල්ලුම කෙරෙහි බලපාන ආකාරය විස්තර කරයි.<br>• ඉල්ලුම් ශ්‍රිතය පැහැදිලි කරයි.<br>• ඉල්ලුම් නීතිය නිර්වචනය කරයි.<br>• ඉල්ලුම් ලේඛනයක්, ඉල්ලුම් වක්‍රයක් හා ඉල්ලුම් සමීකරණයක් ඇසුරෙන් ඉල්ලුම් නීතිය ඉදිරිපත් කරයි.<br>• ඉල්ලුම් නීතියට බලපාන හේතුවක් වන මිල ප්‍රතිවිපාකය නම් කරයි.<br>• ආදායම් ප්‍රතිවිපාකය හා ආදේශන ප්‍රතිවිපාකය ඇසුරෙන් ඉල්ලුම් නීතිය තහවුරු කරයි.<br>• ඉල්ලුම් නීතියට පටහැනි අවස්ථා විස්තර කරයි. | 80<br>08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම හා ඉල්ලුම වෙනස් වීම අතර වෙනස සංසන්දනය කරයි. | • ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම<br>  • ඉල්ලුම් ප්‍රමාණය වැඩි වීම<br>  • ඉල්ලුම් ප්‍රමාණය අඩු වීම<br>• ඉල්ලුම වෙනස් වීම<br>  • ඉල්ලුම වැඩි වීම හා හේතු<br>  • ඉල්ලුම අඩු වීම හා හේතු | • භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම හා ඉල්ලුම වෙනස් වීම අතර වෙනස සසඳයි.<br>• භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම හා ඉල්ලුම වෙනස් වීම කෙරෙහි බලපාන සාධක වෙන් වෙන් ව ඉදිරිපත් කරයි.<br>• භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම ඉල්ලුම් වක්‍රයක් ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• භාණ්ඩයක ඉල්ලුම වෙනස් වීම ඉල්ලුම් වක්‍ර ඇසුරෙන් විග්‍රහ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වමින් මිල ඉල්ලුම් නම්‍යතාව විග්‍රහ කරයි. | • ඉල්ලුම් නම්‍යතාව<br>• අර්ථ දැක්වීම<br>• ප්‍රභේද<br>• මිල ඉල්ලුම් නම්‍යතාව<br>• ආදායම් ඉල්ලුම් නම්‍යතාව<br>• හරස් මිල ඉල්ලුම් නම්‍යතාව<br><br>• මිල ඉල්ලුම් නම්‍යතාව<br>• අර්ථ දැක්වීම<br>• ලක්ෂ්‍ය මිල ඉල්ලුම් නම්‍යතාව<br>• ගණනය කිරීම<br>• චාප මිල ඉල්ලුම් නම්‍යතාව<br>• ගණනය කිරීම<br>• මිල ඉල්ලුම් නම්‍යතාව සහ ඉල්ලුම් වක්‍රයේ බෑවුම<br>• ඉල්ලුම් සමීකරණය ඇසුරෙන් මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කිරීම<br>• මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය අනුව නම්‍යතාවේ ප්‍රභේද | • ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වයි.<br>• ඉල්ලුම් නම්‍යතාවේ ප්‍රභේද නම් කරයි.<br>• මිල ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වයි.<br>• ලක්ෂ්‍ය මිල ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වයි.<br>• සංඛ්‍යා දත්ත පදනම් කර ගනිමින් ලක්ෂ්‍ය මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරයි.<br>• චාප මිල ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වයි.<br>• දී ඇති සංඛ්‍යා දත්ත පදනම් කරගෙන චාප මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරයි.<br>• මිල ඉල්ලුම් නම්‍යතාව සහ ඉල්ලුම් වක්‍රයේ බෑවුම අතර සම්බන්ධය විස්තර කරයි.<br>• ඉල්ලුම් සමීකරණය දී ඇති විට නිශ්චිත මිලකට අදාළ මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරයි.<br>• මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය පදනම් කර ගනිමින් නම්‍යතා ප්‍රභේද ඉදිරිපත් කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.4 මිල ඉල්ලුම් නම්‍යතාව අනුව තාර්කික ව තීරණ ගන්නා අයුරු විමසයි. | • මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක<br>• මිල ඉල්ලුම් නම්‍යතාව සහ පාරිභෝගික පැහැදම/ව්‍යාපාරික අයභාරය අතර සම්බන්ධතාව<br>• මිල ඉල්ලුම් නම්‍යතාවේ වැදගත්කම | • මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක නම් කරයි.<br>• මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක මිල ඉල්ලුම් නම්‍යතාව කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කරයි.<br>• මිල ඉල්ලුම් නම්‍යතාව සහ පාරිභෝගික පැහැදම/ව්‍යාපාරික අයභාරය අතර සම්බන්ධතාව විස්තර කරයි.<br>• මිල ඉල්ලුම් නම්‍යතාවේ වැදගත්කම විස්තර කරයි. | 06 |
| | 2.5 හරස් මිල ඉල්ලුම් නම්‍යතාව අනුව තාර්කික ව තීරණ ගන්නා අයුරු විමසයි. | • හරස් මිල ඉල්ලුම් නම්‍යතාව<br>  • අර්ථ දැක්වීම<br>  • ගණනය කිරීම<br>  • හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය අනුව භාණ්ඩ වර්ග කිරීම<br>    • ආදේශන භාණ්ඩ<br>    • අනුපූරක භාණ්ඩ<br>• හරස් මිල ඉල්ලුම් නම්‍යතාවේ වැදගත්කම | • හරස් මිල ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වයි.<br>• සංඛ්‍යා දත්ත භාවිත කරමින් හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරයි.<br>• හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය පදනම් කරගනිමින් ආදේශන භාණ්ඩ යුගල හා අනුපූරක භාණ්ඩ යුගල වෙන්කර දක්වයි.<br>• හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ වැදගත්කම පෙන්වා දෙයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.6 ආදායම් ඉල්ලුම් නම්‍යතාව අනුව තාර්කික ව තීරණ ගන්නා අයුරු විමසයි. | • ආදායම් ඉල්ලුම් නම්‍යතාව<br>• අර්ථ දැක්වීම<br>• ගණනය කිරීම<br>• සංගුණකය අනුව භාණ්ඩ වර්ග කිරීම<br>• සාමාන්‍ය භාණ්ඩ<br>• අත්‍යවශ්‍ය භාණ්ඩ<br>• සුඛෝපභෝගී භාණ්ඩ<br>• බාල භාණ්ඩ<br>• ආදායම් ඉල්ලුම් නම්‍යතාවේ වැදගත්කම | • ආදායම් ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වයි.<br>• සංඛ්‍යා දත්ත භාවිත කරමින් ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ගණනය කරයි.<br>• ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය පදනම් කර ගනිමින් භාණ්ඩ වර්ග කරයි.<br>• ආදායම් ඉල්ලුම් නම්‍යතාවේ වැදගත්කම පෙන්වා දෙයි. | 06 |
| | 2.7 සැපයුම් තීරක ඇසුරෙන් සැපයුම් න්‍යාය හා සැපයුම් නීතිය විග්‍රහ කරයි. | • සැපයුම<br>• අර්ථ දැක්වීම<br>• ආයතනයක සැපයුම හා වෙළෙඳපොළ සැපයුම<br>• සැපයුම තීරණය කරන සාධක<br>• සැපයුම් න්‍යාය (ශ්‍රිතය)<br>• සැපයුම් නීතිය<br>• සැපයුම් නීතිය ඉදිරිපත් කරන ක්‍රම<br>• සැපයුම් ලේඛනය<br>• සැපයුම් වක්‍රය<br>• සැපයුම් සමීකරණය<br>• සැපයුම් නීතියට හේතු<br>• වැඩි වන ආවස්ථික පිරිවැය නීතිය (ආන්තික පිරිවැය ඉහළ යෑම ) | • සැපයුම අර්ථ දක්වයි.<br>• ආයතනයක සැපයුම හා වෙළෙඳපොළ සැපයුම අතර වෙනස පැහැදිලි කරයි.<br>• සැපයුමට බලපාන සාධක නම් කරයි.<br>• සැපයුම හා සැපයුමට බලපාන සාධක අතර සම්බන්ධය සැපයුම් ශ්‍රිතය ඇසුරෙන් ඉදිරිපත් කරයි.<br>• සැපයුම් නීතිය නිර්වචනය කරයි.<br>• සැපයුම් ලේඛනයක්, සැපයුම් වක්‍රයක් හා සැපයුම් සමීකරණයක් මගින් සැපයුම් නීතිය ඉදිරිපත් කරයි.<br>• සැපයුම් නීතියට හේතුව ලෙස වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය විග්‍රහ කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 2.8 සැපයුම් ප්‍රමාණය වෙනස් වීම හා සැපයුම වෙනස් වීම අතර වෙනස සසඳයි. | • සැපයුම් ප්‍රමාණය වෙනස් වීම<br>• සැපයුම් ප්‍රමාණය වැඩි වීම<br>• සැපයුම් ප්‍රමාණය අඩු වීම<br>• සැපයුම වෙනස් වීම<br>• සැපයුම වැඩි වීම හා ඊට හේතු<br>• සැපයුම අඩු වීම හා ඊට හේතු | • භාණ්ඩයක සැපයුම් ප්‍රමාණය වෙනස් වීම හා සැපයුම වෙනස් වීම අතර වෙනස පැහැදිලි කරයි.<br>• භාණ්ඩයක සැපයුම් ප්‍රමාණය වෙනස් වීම හා සැපයුම වෙනස් වීම කෙරෙහි බලපාන සාධක වෙන් වෙන් ව ඉදිරිපත් කරයි.<br>• භාණ්ඩයක මිල වෙනස් වන විට සැපයුම් ප්‍රමාණය වෙනස් වන ආකාරය සැපයුම් වක්‍රයක් ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• භාණ්ඩයක මිල ස්ථාවර ව පවතින විට අනෙකුත් සාධක වෙනස් වීම අනුව සැපයුම වෙනස් වන ආකාරය සැපයුම් වක්‍ර ඇසුරෙන් විග්‍රහ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.9 සැපයුමේ මිල නම්‍යතාව ගණනය කරමින් එහි භාවිතයේ වැදගත්කම විග්‍රහ කරයි. | • සැපයුමේ මිල නම්‍යතාව<br>• අර්ථ දැක්වීම<br>• ලක්ෂ්‍ය සැපයුමේ මිල නම්‍යතාව<br>• ගණනය කිරීම<br>• චාප සැපයුමේ මිල නම්‍යතාව<br>• ගණනය කිරීම<br>• සැපයුමේ මිල නම්‍යතාව හා සැපයුම් වක්‍රයේ බෑවුම<br>• සැපයුම් සමීකරණය ඇසුරෙන් සැපයුමේ මිල නම්‍යතාව ගණනය කිරිම<br>• සැපයුමේ මිල නම්‍යතා සංගුණකයේ විවිධ ස්වරූප අනුව සැපයුමේ මිල නම්‍යතාවයේ ප්‍රභේද<br>• සැපයුමේ මිල නම්‍යතාවේ තීරක<br>• සැපයුමේ මිල නම්‍යතාවේ වැදගත්කම | • සැපයුමේ මිල නම්‍යතාව අර්ථ දක්වයි.<br>• ලක්ෂ්‍ය සැපයුමේ මිල නම්‍යතාව සහ චාප සැපයුමේ මිල නම්‍යතාව ගණනය කරන ආකාරය විස්තර කරයි.<br>• දෙන ලද දත්ත පදනම් කර ගනිමින් ලක්ෂ්‍ය සැපයුමේ මිල නම්‍යතාව සහ චාප සැපයුමේ මිල නම්‍යතාව ගණනය කර දක්වයි.<br>• සැපයුමේ මිල නම්‍යතාව සහ සැපයුම් වක්‍රයේ බෑවුම අතර සම්බන්ධය විස්තර කරයි.<br>• සැපයුම් සමීකරණය දී ඇති විට නිශ්චිත මිලකට අදාළ සැපයුමේ මිල නම්‍යතාව ගණනය කරයි.<br>• සැපයුමේ මිල නම්‍යතා සංගුණකය පදනම් කරගනිමින් සැපයුමේ මිල නම්‍යතාවේ ප්‍රභේද පෙළ ගස්වයි.<br>• සැපයුමේ මිල නම්‍යතාවේ තීරක විස්තර කරයි.<br>• සැපයුමේ මිල නම්‍යතාවේ වැදගත්කම පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.10 ආර්ථික විද්‍යානුකූල ව වෙළෙඳපොළ විග්‍රහ කරයි. | • වෙළෙඳපොළ<br>• අර්ථ දැක්වීම<br>• කාර්යයන්<br>• වෙළෙඳපොළ වර්ග<br>• භාණ්ඩ හා සේවා වෙළෙඳපොළ<br>• සාධක වෙළෙඳපොළ<br>• භාණ්ඩ හා සේවා වෙළෙඳපොළත් සාධක වෙළෙඳපොළත් අතර වෙනස | • වෙළෙඳපොළ අර්ථ දක්වයි.<br>• වෙළෙඳපොළක කාර්යයන් නම් කරයි.<br>• භාණ්ඩ හා සේවා වෙළෙඳපොළ නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• සාධක වෙළෙඳපොළ නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• භාණ්ඩ හා සේවා වෙළෙඳපොළත් සාධක වෙළෙඳපොළත් අතර වෙනස සංසන්දනාත්මක ව විග්‍රහ කරයි. | 06 |
| | 2.11 වෙළෙඳපොළ සමතුලිතය තීරණය වන ආකාරය පරීක්ෂා කරයි. | • වෙළෙඳපොළ සමතුලිතය<br>• අර්ථ දැක්වීම<br>• වෙළෙඳපොළ සමතුලිතය ඉදිරිපත් කළ හැකි ආකාර<br>• ඉල්ලුම් හා සැපයුම් ලේඛන මඟින්<br>• ඉල්ලුම් හා සැපයුම් වක්‍ර මගින්<br>• ඉල්ලුම් හා සැපයුම් සමීකරණ මගින්<br>• සමතුලිතය ආශ්‍රිත සංකල්ප<br>• අධි ඉල්ලුම<br>• අධි සැපයුම<br>• අධි ඉල්ලුම් මිල<br>• අධි සැපයුම් මිල<br>• පාරිභෝගික අතිරික්තය<br>• නිෂ්පාදක අතිරික්තය<br>• ආර්ථික අතිරික්තය | • වෙළෙඳපොළ සමතුලිතය අර්ථ දක්වයි.<br>• වෙළෙඳපොළ සමතුලිතය ප්‍රකාශ කළ හැකි විකල්ප ක්‍රම නම් කරයි.<br>• ඉල්ලුම් හා සැපයුම් ලේඛන ඇසුරෙන් වෙළෙඳපොළ සමතුලිතය ඉදිරිපත් කරයි.<br>• ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ඇසුරෙන් වෙළෙඳපොළ සමතුලිතය ඉදිරිපත් කරයි.<br>• ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඇසුරෙන් වෙළඳපොළ සමතුලිතය ඉදිරිපත් කරයි.<br>• සමතුලිතය ආශ්‍රිත සංකල්ප අර්ථ දක්වමින් ඒවා ප්‍රස්තාර මගින් ඉදිරිපත් කරයි.<br>• සමතුලිතය ආශ්‍රිත සංකල්ප ගණනය කර පෙන්වයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 2.12 වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වීම විග්‍රහ කරයි. | • වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වීම<br>• සැපයුම නොවෙනස් ව තිබිය දී ඉල්ලුම් වෙනස් වීම<br>• ඉල්ලුම නොවෙනස් ව තිබිය දී සැපයුම වෙනස් වීම<br>• ඉල්ලුම හා සැපයුම එකවර වෙනස් වීම | • වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වීම පැහැදිලි කරයි.<br>• වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වන ආකාරය ඉල්ලුම් සැපයුම් ලේඛන හා සමීකරණ ඇසුරෙන් විග්‍රහ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3. වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි. | 3.1 වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාර විග්‍රහ කරයි. | • වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාර<br>• බදු පැනවීම<br>• සහනාධාර ලබා දීම<br>• මිල පාලනය<br>• මිල ස්ථායීකරණය | • වෙළෙඳපොළට රජය මැදිහත් වන ආකාර පෙන්වා දෙයි. | 30<br>02 |
| | 3.2 වෙළෙඳපොළට රජය මැදිහත් වීම ඒකක බද්දක් ඇසුරෙන් විග්‍රහ කරයි. | • භාණ්ඩ මත බදු පැනවීම<br>• සැපයුම්කරු මත බදු පැනවීම<br>• ගැනුම්කරු මත බදු පැනවීම<br>• බදු අනුපාතික<br>• ප්‍රතිශතක බද්ද<br>• අර්ථ දැක්වීම<br>• ඒකක බද්ද<br>• අර්ථ දැක්වීම<br>• සැපයුම්කරු මත ඒකක බද්දක් පැනවීම<br>• ඒකක බද්ද ගැළපීම<br>• සැපයුම් ලේඛනයට<br>• සැපයුම් වක්‍රයට<br>• සැපයුම් සමීකරණයට<br>• ඒකක බද්දක සුභසාධන ප්‍රතිවිපාකය<br>• පාරිභෝගික අතිරික්තයට<br>• නිෂ්පාදන අතිරික්තයට<br>• රජයේ ආදායමට<br>• සමස්ත සුභසාධනයට<br>• ගැනුම්කරු මත ඒකක බද්දක් පැනවීම හැඳින්වීම | • භාණ්ඩ මත බදු පනවන ආකාර නම් කරයි.<br>• ප්‍රතිශතක බද්ද අර්ථ දක්වයි.<br>• ඒකක බද්ද අර්ථ දක්වයි.<br>• සැපයුම්කරු මත ඒකක බද්දක් පැන වූ විට සැපයුම් වක්‍රයට වන බලපෑම පෙන්වයි.<br>• සැපයුම්කරු මත ඒකක බද්දක් පැන වූ විට වෙළෙඳපොළ සමතුලිතයට ඇතිවන බලපෑම ඉල්ලුම් හා සැපයුම් ලේඛනයක් ඇසුරෙන් පෙන්වයි.<br>• සැපයුම්කරු මත ඒකක බද්දක් පැනවීම වෙළෙඳපොළ සමතුලිතයට ඇති කරන බලපෑම ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ඇසුරෙන් පෙන්වයි.<br>• සැපයුම්කරු මත ඒකක බද්දක් පැන වූ විට වෙළෙඳපොළ සමතුලිතයට ඇති වන බලපෑම ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඇසුරෙන් පෙන්වයි.<br>• ඒකක බද්දක සුභසාධන ප්‍රතිවිපාකය විග්‍රහ කරයි.<br>• ගැනුම්කරු මත ඒකක බද්දක් පැනවීම හඳුන්වයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 සැපයුම්කරු මත ඒකක බද්දක් පැනවීමෙන් පසු බදු බර බෙදී යන ආකාරය විග්‍රහ කරයි. | • බදු බර බෙදී යන ආකාර ඉල්ලුම් හා සැපයුම් වක්‍ර මගින් ඉදිරිපත් කිරිම | • බදු බර යන්න හඳුන්වයි.<br>• ඉල්ලුමේ හා සැපයුමේ මිල නම්‍යතාවේ ස්වරූපය මත ඒකක බද්දක් පැනවීමෙන් බදු බර පාරිභෝගිකයා හා නිෂ්පාදකයා අතර බෙදී යන ආකාරය විස්තර කරයි. | 04 |
| | 3.4 සැපයුම්කරුවන්ට ඒකක සහනාධාරයක් ලබා දීම ඇසුරෙන් වෙළෙඳපොළට රජයේ මැදිහත් වීම විග්‍රහ කරයි. | • සැපයුම්කරු වෙත ඒකක සහනාධාර ලබා දීම<br>• ඒකක සහනාධාර අර්ථ දැක්වීම<br>  • ඒකක සහනාධාර ගැළපීම<br>    • සැපයුම් ලේඛනයට<br>    • සැපයුම් වක්‍රයට<br>    • සැපයුම් සමීකරණයට<br>• ඒකක සහනාධාරයක සුභසාධන ප්‍රතිවිපාකය<br>    • පාරිභෝගික අතිරික්තයට<br>    • නිෂ්පාදක අතිරික්තයට<br>    • රජයේ ආදායමට<br>    • සමස්ත සුභසාධනයට | • සැපයුම්කරු වෙත ලබා දෙන ඒකක සහනාධාරය අර්ථ දක්වයි.<br>• සැපයුම්කරු වෙත ඒකක සහනාධාරය ලබා දුන් විට වෙළෙඳපොළ සමතුලිතය කෙරෙහි ඇති වන බලපෑම ඉල්ලුම් හා සැපයුම් ලේඛන ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• සැපයුම්කරු වෙත ඒකක සහනාධාරය ලබාදුන් විට වෙළෙඳපොළ සමතුලිතය කෙරෙහි ඇති වන බලපෑම ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• සැපයුම්කරු වෙත ඒකක සහනාධාර-යක් ලබාදුන් විට වෙළෙඳපොළ සමතුලිතය කෙරෙහි ඇති වන බලපෑම ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• ඒකක සහනාධාරයක සුභසාධන ප්‍රතිවිපාකය විග්‍රහ කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.5 මිල පාලනය හා මිල ස්ථායීකරණය වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට ඇති කරන බලපෑම විමසයි. | • මිල පාලනය<br>  • අර්ථ දැක්වීම<br>  • මිල පාලනයේ විවිධ ස්වරූප<br>    • උපරිම මිල ප්‍රතිපත්තිය<br>    • අවම මිල ප්‍රතිපත්තිය<br>• උපරිම මිල<br>  • සඵල උපරිම මිල හා ඒ ආශ්‍රිත වෙනස්කම්<br>  • ආර්ථික ප්‍රතිවිපාක<br>  • උපරිම මිල පාලනය අර්ථවත් කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග<br>• අවම මිල<br>  • සඵල අවම මිල<br>  • ආර්ථික ප්‍රතිවිපාක<br>  • අවම මිලක් සහතික මිලක් බවට පත්කර ගත හැකි ක්‍රියාමාර්ග<br>  • අධි සැපයුම මිලට ගැනීම<br>  • ඌන පූර්ණ ගෙවීම<br>• මිල ස්ථායීකරණය | • මිල පාලනය යන්න අර්ථ දක්වයි.<br>• මිල පාලනයේ විවිධ ස්වරූප නම් කරයි.<br>• උපරිම මිල ප්‍රතිපත්තිය අර්ථ දක්වා ඉල්ලුම් සැපයුම් වක්‍ර ආශ්‍රිත ව නිරූපණය කරයි.<br>• උපරිම මිල ප්‍රතිපත්තියෙහි ආර්ථික ප්‍රතිවිපාක විග්‍රහ කරයි.<br>• උපරිම මිල ප්‍රතිපත්තිය අර්ථවත් කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරයි.<br>• අවම මිල ප්‍රතිපත්තිය අර්ථ දක්වා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ආශ්‍රිත ව නිරූපණය කරයි.<br>• අවම මිල ප්‍රතිපත්තියේ ආර්ථික ප්‍රතිවිපාක ඉදිරිපත් කරයි.<br>• අවම මිල ප්‍රතිපත්තිය අර්ථවත් කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග විස්තර කරයි.<br>• සහතික මිල ප්‍රතිපත්තිය අර්ථ දක්වයි.<br>• අවම මිලක් සහතික මිලක් බවට පත්කර ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.<br>• මිල ස්ථායීකරණය ක්‍රියාමාර්ග හඳුන්වයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4. වෙළෙඳපොළ තුළ නිෂ්පාදන ආයතන තාර්කික ව හැසිරෙන ආකාරය හා නිෂ්පාදන සාධක වෙළෙඳපොළ හැසිරීම ගවේෂණය කරයි. | 4.1 ව්‍යාපාර ආයතනයක කෙටි කාලීන හා දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වරූපය විග්‍රහ කරයි. | • ව්‍යාපාර ආයතන<br>  • හැඳින්වීම<br>• නිෂ්පාදන ක්‍රියාවලිය<br>  • නිෂ්පාදන ශ්‍රිතය<br>  • කෙටි කාලය<br>  • දිගු කාලය<br>• කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය<br>  • හීනවන ආන්තික ඵලදා නීතිය<br>  • මුළු නිෂ්පාදිතය<br>  • සාමාන්‍ය නිෂ්පාදිතය<br>  • ආන්තික නිෂ්පාදිතය<br>• දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය<br>  • පරිමාණානුකූල ඵල නීතිය<br>    • වැඩිවන පරිමාණානුකූල ඵල<br>    • අඩුවන පරිමාණානුකූල ඵල<br>    • ස්ථාවර පරිමාණානුකූල ඵල | • ව්‍යාපාර ආයතන හඳුන්වමින් ඒවායේ විවිධ ස්වරූප පැහැදිලි කරයි.<br>• යෙදවුම් හා නිමැවුම් අතර පවතින සම්බන්ධතාව නිෂ්පාදන ශ්‍රිතයක් ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• නිෂ්පාදනයේ කෙටි කාලය හා දිගු කාලය අතර වෙනස නිෂ්පාදන ශ්‍රිතයක් ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• හීනවන ආන්තික ඵලදා නීතිය අර්ථ දක්වයි.<br>• හීනවන ආන්තික ඵලදා නීතියේ උපකල්පන ඉදිරිපත් කරයි.<br>• හිනවන ආන්තික ඵලදා නීතිය සංඛ්‍යාත්මකව සහ ප්‍රස්තාරිකව ඉදිරිපත් කරයි.<br>• කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ මුළු නිෂ්පාදිතය, සාමාන්‍ය නිෂ්පාදිතය සහ ආන්තික නිෂ්පාදිතය යන සංකල්ප අර්ථ දක්වයි.<br>• මුළු නිෂ්පාදිතය, සාමාන්‍ය නිෂ්පාදිතය සහ ආන්තික නිෂ්පාදිතය යන සංකල්ප අතර සම්බන්ධතාව විග්‍රහ කරයි.<br>• පරිමාණානුකූල ඵල නීතිය අර්ථ දක්වයි.<br>• දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ වැඩි වන, අඩු වන හා ස්ථාවර පරිමාණානුකූල ඵල තත්ත්වලට බලපාන හේතු විග්‍රහ කරයි. | 50<br><br>08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 නිෂ්පාදන පිරිවැය ආශ්‍රිත මූලික සංකල්ප සංසන්දනාත්මක ව විග්‍රහ කරයි. | • නිෂ්පාදන පිරිවැය<br>  • හැඳින්වීම<br>• නිෂ්පාදන පිරිවැය සම්බන්ධ මූලික සංකල්ප<br>  • ඍජු පිරිවැය හා වක්‍ර පිරිවැය<br>  • ගිණුම්කරණ පිරිවැය හා ආර්ථික පිරිවැය<br>  • යට කළ පිරිවැය/ගිලුණු පිරිවැය<br>  • ප්‍රාමාණික ලාභ පිරිවැයක් ලෙස | • නිෂ්පාදන පිරිවැය හඳුන්වයි.<br>• නිෂ්පාදන පිරිවැය හා සම්බන්ධ මූලික සංකල්ප පැහැදිලි කරයි.<br>• ඍජු පිරිවැය හා වක්‍ර පිරිවැය අතර වෙනස නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• ගිණුම්කරණ පිරිවැය හා ආර්ථික පිරිවැය අතර වෙනස නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• යට කළ පිරිවැය හෙවත් ගිලුණු පිරිවැය නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• ප්‍රාමාණික ලාභ අර්ථ දක්වයි.<br>• ප්‍රාමාණික ලාභය නිෂ්පාදන පිරිවැයෙහි ඇතුළත් කිරීමට හේතු දක්වයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.3 නිෂ්පාදන ක්‍රියාවලියේ දී පිරිවැය හැසිරෙන ආකාරය විශ්ලේෂණය කරයි. | • කෙටි කාලීන නිෂ්පාදන පිරිවැයෙහි මූලිකාංග සංඛ්‍යාත්මක ව හා ප්‍රස්තාරික ව ඉදිරිපත් කිරීම<br>• මුළු ස්ථාවර පිරිවැය (TFC)<br>• මුළු විචල්‍ය පිරිවැය (TVC)<br>• මුළු පිරිවැය (TC)<br>• සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)<br>• සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)<br>• සාමාන්‍ය මුළු පිරිවැය (ATC)<br>• ආන්තික පිරිවැය (MC)<br>• කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය වක්‍ර හා ඵලදායිතා වක්‍ර අතර සම්බන්ධතාව<br>• දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයෙහි හැසිරීම | • කෙටි කාලීන නිෂ්පාදන පිරිවැයේ මූලිකාංග අර්ථ දක්වයි.<br>• කෙටි කාලීන නිෂ්පාදන පිරිවැයෙහි මූලිකාංග ගණනය කර පෙන්වයි.<br>• කෙටි කාලීන නිෂ්පාදන පිරිවැයෙහි මූලිකාංග ලේඛන හා ප්‍රස්තාර ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය වක්‍ර සහ ඵලදායිතා වක්‍ර අතර සම්බන්ධතාව විග්‍රහ කරයි.<br>• දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයෙහි හැසිරීම හා පරිමාණානුකූල ඵල අතර සම්බන්ධතාව විග්‍රහ කරයි.<br>• පරිමාණානුකූල පිරිමැසුම් හා නොපිරිමැසුම් අර්ථ දක්වයි.<br>• පරිමාණානුකූල පිරිමැසුම් හා නොපිරිමැසුම්වලට හේතු දක්වයි. | 08 |
| | 4.4 වෙළෙඳපොළ ව්‍යුහයන්හි මූලික ලක්ෂණ සංසන්දනය කරයි. | • වෙළෙඳපොළ ව්‍යුහ හා ඒවායේ මූලික ලක්ෂණ<br>• පූර්ණ තරගය<br>• ඒකාධිකාරය<br>• ඒකාධිකාරී තරගය<br>• කතිපයාධිකාරය | • වෙළෙඳපොළ ව්‍යුහ නම් කරයි.<br>• පූර්ණ තරගකාරී වෙළෙඳපොළක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.<br>• ඒකාධිකාරී වෙළෙඳපොළක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.<br>• ඒකාධිකාරී තරග වෙළෙඳපොළක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.<br>• කතිපයාධිකාරී වෙළෙඳපොළක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.<br>• වෙළෙඳපොළ ව්‍යුහවල මූලික ලක්ෂණ සංසන්දනය කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.5 පූර්ණ තරගකාරී ආයතනයක් සහ කර්මාන්තය කෙටි කාලයේ දී හැසිරෙන ආකාරය විමසා බලයි. | • පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය හා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය<br>• ආයතනයක් ලාභ උපරිම කිරීමේ මූලික ප්‍රවේශ<br>• මුළු අයභාරය - මුළු පිරිවැය ප්‍රවේශය<br>• ආන්තික අයභාරය - ආන්තික පිරිවැය ප්‍රවේශය<br>• පූර්ණ තරගකාරී ආයතනයක කෙටිකාලීන හැසිරීම (සංඛ්‍යාත්මක ව හා ප්‍රස්තාරික ව)<br>• ප්‍රාමාණික ලාභ<br>• නිෂ්ප්‍රාමාණික ලාභ<br>• අවප්‍රාමාණික ලාභ<br>• පාඩු සහිත ව කටයුතු කිරීම<br>• ආයතනය නිෂ්පාදනය අත්හිටුවීම<br>• කෙටිකාලීන සැපයුම් වක්‍රය<br>• වෙළෙඳපොළ සැපයුම් වක්‍රය<br>• කර්මාන්තයේ සමතුලිතය | • පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය හා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය වෙන් වෙන් ව හඳුන්වයි.<br>• ආයතනයක ඉල්ලුම් වක්‍රය හා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය අතර සම්බන්ධතාව ප්‍රස්තාර ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• ආයතනයක් ලාභ උපරිම කිරීමේ මූලික ප්‍රවේශ නම් කරයි.<br>• මුළු අයභාරය - මුළු පිරිවැය ප්‍රවේශය සංඛ්‍යා ලේඛන හා ප්‍රස්තාර ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• ආන්තික අයභාරය - ආන්තික පිරිවැය ප්‍රවේශය සංඛ්‍යා ලේඛන හා ප්‍රස්තාර ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• පූර්ණ තරගකාරී ආයතනයක කෙටි කාලයේ හැසිරීම සංඛ්‍යා ලේඛන හා ප්‍රස්තාර ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• පූර්ණ තරගකාරී ආයතනයක ප්‍රාමාණික ලාභ, නිෂ්ප්‍රාමාණික ලාභ, අවප්‍රාමාණික ලාභ හා ආයතනයක නිෂ්පාදනය අත්හිටුවීම යන සංකල්ප ප්‍රස්තාර ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• ආයතනයක කෙටි කාලීන සැපයුම් වක්‍රයේ හැසිරීම ප්‍රස්තාර සටහන් ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• වෙළෙඳපොළ සැපයුම් වක්‍රය හා ඉල්ලුම් වක්‍රය මගින් කර්මාන්තයේ සමතුලිතය ප්‍රස්තාර සටහන් ඇසුරෙන් විග්‍රහ කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.6 නිෂ්පාදන සාධක වෙළෙඳපොළ හැසිරීම විමසයි. | ● නිෂ්පාදන සාධක වෙළෙඳපොළ<br>● සාධක ඉල්ලුම<br>● සාධක සැපයුම<br>● සාධක මිල<br>● සාධක ඉපැයුම<br>● සංක්‍රාම ඉපැයුම<br>● ආර්ථික බද්ද කුලිය | ● සාධක ඉල්ලුම විග්‍රහ කරයි.<br>● සාධක සැපයුම විග්‍රහ කරයි.<br>● සාධක මිල තීරණය වන ආකාරය විග්‍රහ කරයි.<br>● නිෂ්පාදන සාධක ඉපැයුම විස්තර කරයි.<br>● සංක්‍රාම ඉපැයුම හා ආර්ථික බද්ද කුලීය ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇසුරෙන් පෙන්වයි.<br>● සංක්‍රාම ඉපැයුම හා ආර්ථික බද්ද කුලිය අතර වෙනස නිදසුන් සහිත ව පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 05. සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගනිමින් ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | | | | 55 |
| | 5.1 සාර්ව ආර්ථික අරමුණු, සාර්ව ආර්ථික ගැටලු සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති විමසයි. | • සාර්ව ආර්ථික අරමුණු සහ විචල්‍යයන්<br>• සාර්ව ආර්ථික ගැටලු<br>  • සාර්ව ආර්ථික උච්චාවචන<br>    • ව්‍යාපාර චක්‍රය<br>    • විවිධ අදියර<br>      • ප්‍රසාරණය<br>      • සංකෝචනය<br>      • මුදුන<br>      • පතුල<br>  • විභව නිමැවුම හා සැබෑ නිමැවුම<br>    • නිමැවුම් පරතරය<br>• සාර්ව ආර්ථික ප්‍රතිපත්ති | • සාර්ව ආර්ථික අරමුණු සහ සාර්ව ආර්ථික විචල්‍ය නම් කරයි.<br>• සාර්ව ආර්ථික ගැටලු විස්තර කරයි.<br>• ව්‍යාපාර චක්‍රය හඳුන්වයි.<br>• ව්‍යාපාර චක්‍රයක විවිධ අදියර හඳුන්වයි.<br>• ව්‍යාපාර චක්‍ර ඇසුරෙන් ආර්ථික උච්චාවචන පැහැදිලි කරයි.<br>• සාර්ව ආර්ථික ප්‍රතිපත්ති විස්තර කරයි. | 06 |
| | 5.2 වෘත්තාකාර ප්‍රවාහය ආශ්‍රයෙන් ජාතික ගිණුම්කරණයේ විවිධ ප්‍රවේශ විග්‍රහ කරයි. | • ආර්ථික කාරක<br>• වෘත්තාකාර ප්‍රවාහය (සරල ආර්ථිකයක)<br>  • ආර්ථික කාරක අතර අන්තර් සම්බන්ධතාව<br>• ජාතික ගිණුම්කරණයේ ප්‍රවේශ<br>  • නිමැවුම් ප්‍රවේශය<br>  • ආදායම් ප්‍රවේශය<br>  • වියදම් ප්‍රවේශය | • ආර්ථික කටයුතුවලට සම්බන්ධ ආර්ථික කාරක නම් කරමින් පැහැදිලි කරයි.<br>• සරල ආර්ථිකයක වෘත්තාකාර ප්‍රවාහය ඇසුරෙන් ආර්ථිකයක කාරක අතර පවතින අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරයි.<br>• සරල ආර්ථිකයක වෘත්තාකාර ප්‍රවාහය ඇසුරෙන් ජාතික ගිණුම්කරණයේ ප්‍රවේශ තුන මතු කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3 නිමැවුම් ප්‍රවේශයට අනුව ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • නිමැවුම් ප්‍රවේශය යටතේ ජාතික ගිණුම් සකස් කිරීම<br>• බහු ගණන දෝෂය<br>• බහු ගණන දෝෂය මග හරවා ගැනීමේ ක්‍රම<br>  • අවසාන නිමැවුම් ක්‍රමය<br>  • එකතු කළ වටිනාකම් ක්‍රමය<br>    • දළ නිමැවුමේ වටිනාකම සහ අතරමැදි යෙදවුම් වටිනාකම | • බහු ගණන දෝෂය පැහැදිලි කරයි.<br>• අවසාන නිමැවුම් ක්‍රමය පැහැදිලි කර එම ක්‍රමය යටතේ ජාතික ගිණුම් සකස් කරන ආකාරය ඉදිරිපත් කරයි.<br>• එකතු කළ වටිනාකම් ක්‍රමය පැහැදිලි කර එම ක්‍රමය යටතේ ජාතික ගිණුම් සකස් කරන ආකාරය ඉදිරිපත් කරයි.<br>• දළ නිමැවුමේ වටිනාකම යන සංකල්පය විස්තර කරයි.<br>• අතරමැදි යෙදවුම් වටිනාකම යන සංකල්පය විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.4 නිෂ්පාදන ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කරන ආකාරය සහ ඒ ආශ්‍රිත සංකල්ප විග්‍රහ කරයි. | ● නිෂ්පාදන ඉම<br>● ශ්‍රී ලංකාවේ සම්මත කර්මාන්ත කටයුතු වර්ගීකරණය ඇසුරෙන් ආර්ථික ක්‍රියාකාරකම්<br>● ආයතනික අංශ අනුව ආර්ථික ක්‍රියාකාරකම්වල සංයුතිය.<br>  ● මූල්‍ය නොවන අංශය<br>  ● මූල්‍ය අංශය<br>  ● රාජ්‍ය අංශය<br>  ● ගෘහ ඒකක අංශය<br>  ● ලාභ නොලබන ගෘහ ඒකක හා සේවය සලසන ආයතන<br>  ● අවශේෂ ලෝකය<br>● වටිනාකම් තක්සේරු කිරීමේ විවිධ මිල ගණන්<br>  ● මූලික මිල<br>  ● නිෂ්පාදකයාගේ මිල<br>    ● නිෂ්පාදනය මත අය කරන බදු<br>    ● නිෂ්පාදන මත සහනාධාර<br>  ● ගැනුම්කරුගේ මිල<br>    ● වෙළෙඳ තීරුව හා ප්‍රවාහන අයකිරීම්<br>    ● පාරිභෝගික සහනාධාර<br>    ● පාරිභෝගික බදු<br>● වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිත / දළ ජාතික ආදායම<br>● කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ සංයුතිය<br>● නිමැවුම් ප්‍රවේශය ආශ්‍රිත සංකල්ප<br>  ● දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම<br>    ● පවත්නා මිලට<br>    ● ස්ථාවර මිලට<br>  ● අවධමනකය<br>  ● දළ දේශීය නිෂ්පාදිතය හා ශුද්ධ දේශීය නිෂ්පාදිතය<br>  ● ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය<br>  ● දළ ජාතික ආදායම<br>  ● ශුද්ධ ජාතික ආදායම | ● නිෂ්පාදන ඉම පැහැදිලි කරයි<br>● නිෂ්පාදන ඉම තුළ ඇතුළත් කළ යුතු හා බැහැර කළ යුතු අයිතම පැහැදිලි කරයි.<br>● ශ්‍රී ලංකාවේ සම්මත කර්මාන්ත කටයුතු ආශ්‍රයෙන් ආර්ථික ක්‍රියාකාරකම් හඳුන්වයි.<br>● ආයතනික අංශ අනුව ආර්ථික ක්‍රියාකාරකම්වල සංයුතිය විස්තර කරයි.<br>● වටිනාකම් තක්සේරු කිරීමේ විවිධ මිල ගණන් නම් කරයි.<br>● මූලික මිල, නිෂ්පාදකයාගේ මිල හා ගැනුම්කරුගේ මිල යන සංකල්ප නිදසුන් ආශ්‍රයෙන් විස්තර කරයි.<br>● වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය සහ දළ ජාතික ආදායම යන සංකල්ප විස්තර කරයි.<br>● ශ්‍රී ලංකාවේ කර්මාන්ත ශාලා නිෂ්පාදිත දර්ශකයේ සංයුතිය දක්වයි.<br>● නිමවුම් ප්‍රවේශය ආශ්‍රිත සංකල්ප පැහැදිලි කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.5 ආදායම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කරන ආකාරය සහ ආශ්‍රිත සංකල්ප විමසයි. | • දේශීය ආදායම් මූලාශ්‍රය<br>• සේවා නියුක්ති ආදායම<br>• ශුද්ධ පොලිය<br>• බදු කුලිය<br>• සමාගම් ලාභ<br>• ස්වයං රැකියා හා වෘත්තිකයන්ගේ ආදායම /මිශ්‍ර ආදායම<br>• ශ්‍රී ලංකාවේ දළ දේශීය ආදායම් සංරචක<br>• සේවක ආදායම්<br>• දළ මෙහෙයුම් අතිරික්තය<br>• ශුද්ධ මෙහෙයුම් අතිරික්තය<br>• මිශ්‍ර ආදායම්<br>• ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය<br>• නිෂ්පාදනය මත වෙනත් බදු (එම සහනාධාර)<br>• මූලික මිල ගණන් අනුව දළ දේශීය ආදායම<br>• ආදායම් ප්‍රවේශය ආශ්‍රිත සංකල්ප<br>• ප්‍රාථමික ආදායම<br>• දළ දේශීය ආදායම් සහ ශුද්ධ දේශීය ආදායම<br>• දළ ජාතික ආදායම හා ශුද්ධ ජාතික ආදායම<br>• වැය කළ හැකි ජාතික ආදායම<br>• කුටුම්බ ආදායම /පෞද්ගලික ආදායම<br>• වැය කළ හැකි කුටුම්බ ආදායම<br>• මූර්ත ජාතික ආදායම | • දේශීය ආදායම් මූලාශ්‍රය විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ දළ දේශීය ආදායම් සංරචක දක්වයි.<br>• ආදායම් ප්‍රවේශය ආශ්‍රිත සංකල්ප විස්තර කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.6 වියදම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කරන ආකාරය සහ ආශ්‍රිත සංකල්ප විමසයි | • දළ දේශීය වියදමේ මූලාශ්‍රය<br>• කුටුම්බ පරිභෝජන වියදම<br>• දළ ආයෝජන වියදම<br>• රජය මිල දී ගැනීම්<br>• ශ්‍රී ලංකාවේ දළ දේශීය වියදම<br>• පෞද්ගලික පරිභෝජන වියදම<br>• රාජ්‍ය පරිභෝජන වියදම<br>• දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය<br>• වියදම් ප්‍රවේශය යටතේ දළ දේශීය වියදම<br>• වියදම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතය<br>• වියදම් ප්‍රවේශය යටතේ දළ ජාතික ආදායම<br>• වියදම් ප්‍රවේශය ආශ්‍රිත සංකල්ප<br>• වෙළෙඳපොළ මිල යටතේ වැය කළ හැකි දළ ජාතික ආදායම<br>• දේශීය ඉතුරුම් හා ජාතික ඉතුරුම්<br>• මුළු සම්පත් හා සම්පත් උපයෝජනය | • දළ දේශීය වියදම පැහැදිලි කරයි.<br>• දළ දේශීය වියදමේ සංරචක නම් කරමින් විස්තර කරයි.<br>• දළ දේශීය වියදම ගණනය කරයි.<br>• දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරයි.<br>• දළ ජාතික ආදායම ගණනය කරයි.<br>• වියදම් ප්‍රවේශය ආශ්‍රිත සංකල්ප විස්තර කරයි. | 08 |
| | 5.7 ජාතික ගිණුම්කරණයේ වැදගත්කම හා ජාතික ගිණුම්කරණයේ සීමා විග්‍රහ කරයි. | • ජාතික ගිණුම්කරණයේ වැදගත්කම<br>• ජාතික ගිණුම්කරණයේ සීමා<br>• හරිත දළ දේශීය නිෂ්පාදිතය | • ජාතික ගිණුම්කරණයේ වැදගත්කම විස්තර කරයි.<br>• ජාතික ගිණුම්කරණයේ සීමා ඉදිරිපත් කරයි.<br>• හරිත දළ දේශීය නිෂ්පාදිතය යන සංකල්පය නිදසුන් ආශ්‍රයෙන් විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6. සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය විග්‍රහ කරයි. | 6.1 සාර්ව ආර්ථික සමතුලිතය හා අසමතුලිතය විග්‍රහ කරයි. | • සාර්ව ආර්ථික සමතුලිතය සහ අසමතුලිතය<br>• සාර්ව ආර්ථික සමතුලිතය ඉදිරිපත් කළ හැකි විකල්ප ප්‍රවේශ<br>• සමාහාර ආදායම = සමාහාර වියදම ප්‍රවේශය (Y=E)<br>• කාන්දු වීම් = විදීම් ප්‍රවේශය (W=J)<br>• සමාහාර ඉල්ලුම = සමාහාර සැපයුම ප්‍රවේශය (AD=AS) | • සාර්ව ආර්ථික සමතුලිතය යන්න අර්ථ දක්වයි.<br>• සාර්ව ආර්ථික අස්ථායිතාව යන්න අර්ථ දක්වයි.<br>• සාර්ව ආර්ථික සමතුලිතය ඉදිරිපත් කළ හැකි විකල්ප ප්‍රවේශ පැහැදිලි කරයි. | 35<br><br>05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 සමාහාර වියදමේ සංරචක විග්‍රහ කරයි. | • සමාහාර වියදමේ සංරචක<br>• කුටුම්බ පරිභෝජන වියදම් (C)<br>• පරිභෝජන ශ්‍රිතය<br>• අර්ථ දැක්වීම<br>• ස්වායත්ත පරිභෝජනය හා ආන්තික පරිභෝජන නැම්යාව<br>• ප්‍රස්තාරික නිරූපණය<br>• කුටුම්බ පාරිභෝජන වියදම් හා කුටුම්බ ඉතුරුම් අතර සම්බන්ධතාව<br>• ඉතුරුම් ශ්‍රිතය<br>• අර්ථ දැක්වීම<br>• නිර්-ඉතුරුම් හා ආන්තික ඉතුරුම් නැම්යාව<br>• සාමාන්‍ය පරිභෝජන නැම්යාව හා සාමාන්‍ය ඉතුරුම් නැම්යාව<br>• ආයෝජන වියදම (I)<br>• රජයේ මිල දී ගැනීම් (G)<br>• ශුද්ධ අපනයන NX /(X-M) | • සමාහාර වියදමේ සංරචක පැහැදිලි කරයි.<br>• පරිභෝජන ශ්‍රිතය අර්ථ දක්වයි.<br>• පරිභෝජන ශ්‍රිතය ඇසුරින් ස්වායත්ත පරිභෝජනය හා ආන්තික පරිභෝජන නැම්යාව විස්තර කරයි.<br>• ස්වායත්ත පරිභෝජනය හා ආන්තික පරිභෝජන නැම්යාව ප්‍රස්තාරිකව නිරූපණය කරයි.<br>• කුටුම්බ පරිභෝජන වියදම් හා කුටුම්බ ඉතුරුම් අතර සම්බන්ධතාව සමීකරණය හා ප්‍රස්තාර ඇසුරෙන් විමසයි.<br>• ඉතුරුම් ශ්‍රීතය අර්ථ දක්වයි<br>• ඉතුරුම් ශ්‍රීතය ඇසුරෙන් නිර්-ඉතුරුම් හා ආන්තික ඉතුරුම් නැම්යාව විස්තර කරයි.<br>• නිර්-ඉතුරුම් හා ආන්තික ඉතුරුම් නැම්යාව ප්‍රස්තාරිකව නිරූපණය කරයි.<br>• සාමාන්‍ය පරිභෝජන නැම්යාව හා සාමාන්‍ය ඉතුරුම් නැම්යාව ප්‍රස්තාර ඇසුරෙන් විමසයි.<br>• ආයෝජන වියදම්, රජයේ මිල දී ගැනීම් සහ ශුද්ධ අපනයන හඳුන්වයි.<br>• ස්වායත්ත ආයෝජන වියදම සහ රජයේ මිල දී ගැනීම් ප්‍රස්තාරිකව නිරූපණය කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.3 විවිධ ප්‍රවේශ ඔස්සේ සාර්ව ආර්ථික සමතුලිතය විශ්ලේෂණය කරයි. | • සමතුලිත ආදායම් මට්ටම<br>• සමාහාර ආදායම = සමාහාර වියදම ප්‍රවේශය<br>  • සංඛ්‍යා ලේඛන ඇසුරෙන්<br>  • ප්‍රස්තාර ඇසුරෙන්<br>  • සමීකරණ ඇසුරෙන්<br>• කාන්දු වීම් = විදීම් ප්‍රවේශය<br>  • සංඛ්‍යා ලේඛන ඇසුරෙන්<br>  • ප්‍රස්තාර ඇසුරෙන්<br>  • සමීකරණ ඇසුරෙන්<br>• සමාහාර ආදායම = වියදම ප්‍රවේශය සහ කාන්දු වීම් = විදීම් ප්‍රවේශය අතර සම්බන්ධතාව | • සමාහාර ආදායම = සමාහාර වියදම ප්‍රවේශය හරහා සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය සංඛ්‍යා ලේඛන ඇසුරෙන් ඉදිරිපත් කරයි.<br>• සමාහාර ආදායම = සමාහාර වියදම් ප්‍රවේශය මගින් සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය ප්‍රස්තාර ඇසුරෙන් ඉදිරිපත් කරයි.<br>• සමාහාර ආදායම = සමාහාර වියදම් ප්‍රවේශය මගින් සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය සමීකරණ ඇසුරෙන් ඉදිරිපත් කරයි.<br>• කාන්දු වීම් = විදීම් ප්‍රවේශය මගින් සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය සංඛ්‍යා ලේඛන ඇසුරෙන් ඉදිරිපත් කරයි.<br>• කාන්දු වීම් = විදීම් ප්‍රවේශය මගින් සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය ප්‍රස්තාර ඇසුරෙන් ඉදිරිපත් කරයි.<br>• කාන්දු වීම් = විදීම් ප්‍රවේශය මගින් සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය සමීකරණ ඇසුරෙන් ඉදිරිපත් කරයි.<br>• සමාහාර ආදායම = වියදම ප්‍රවේශය හා කාන්දු වීම් = විදීම් ප්‍රවේශය අතර සම්බන්ධතාව සංඛ්‍යා ලේඛන හා ප්‍රස්තාර ඇසුරෙන් පෙන්වයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.4 සමාහාර ඉල්ලුමේ සංරචක වෙනස් වීම මත සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වීම් ගුණක ක්‍රියාවලිය ඇසුරෙන් පෙන්වා දෙයි. | • සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වීම<br>• සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වීමට බලපාන සාධක<br>• ස්වායත්ත වියදම් වර්ග වෙනස් වීම<br>  • ස්වායත්ත පරිභෝජන වියදම<br>  • ස්වායත්ත ආයෝජන වියදම<br>  • රජයේ වියදම<br>  • රජයේ බදු<br>  • සංක්‍රාම<br>  • පරිභෝජන ශ්‍රිතය වෙනස් වීම<br>  • ආයෝජන ශ්‍රිතය වෙනස් වීම<br>  • ශුද්ධ අපනයන<br>• ගුණක ක්‍රියාවලිය (සරල ආර්ථික ආකෘතිය ඇසුරින්)<br>  • ලේඛනයක් මගින්<br>  • සමීකරණයක් මගින්<br>• ආයෝජන ගුණකය<br>• රජයේ වියදම් ගුණකය<br>• බදු ගුණකය<br>• සංක්‍රාම ගුණකය<br>• තුලිත අයවැය ගුණකය<br>• පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම හා සමතුලිත ජාතික ආදායම් මට්ටම අතර වෙනස | • සාර්ව ආර්ථික සමතුලිතය වෙනස්වීම පැහැදිලි කරයි.<br>• සාර්ව ආර්ථිකයක සමතුලිතය වෙනස් වීමට බලපාන සාධක නම් කරයි.<br>• ස්වායත්ත වියදම් වර්ග වෙනස්වීම අනුව සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වන ආකාරය ඉදිරිපත් කරයි.<br>• පරිභෝජන ශ්‍රිතය වෙනස්වීම අනුව සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.<br>• ආයෝජන ශ්‍රිතය වෙනස්වීම අනුව ආර්ථිකයක සමතුලිතය වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.<br>• සාර්ව ආර්ථිකයක ගුණක ක්‍රියාවලිය හඳුන්වයි.<br>• ආර්ථිකයක ගුණක ක්‍රියාවලිය ලේඛනයක් හා සමීකරණයක් ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• ආයෝජන ගුණකය, රජයේ වියදම ගුණකය, බදු ගුණකය, සංක්‍රාම ගුණකය සහ තුලිත අය වැය ගුණකය සංඛ්‍යාත්මකව විස්තර කරයි.<br>• සමතුලිත ආදායම, පූර්ණ සේවා නියුක්ති මට්ටම මත හා ඉන් බැහැර ව පිහිටන අවස්ථා විස්තර කරයි. | 10 |
| | | | | 300 |

## 6.2-13 වන ශ්‍රේණිය විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7. මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි. | | | | 60 |
| | 7.1 මුදල්, මුදල් වර්ග හා මුදලේ කාර්යයන් විමසා බලයි. | • මුදල්<br>• නිර්වචනය<br>• මුදලේ කාර්යයන්<br>• මුදල් වර්ග<br>• ව්‍යවහාර මුදල්<br>• බැංකු මුදල්<br>• ආසන්න මුදල්<br>• මුදල් ආදේශක<br>• විද්‍යුත් මුදල් | • මුදල් අර්ථකථනය කරයි.<br>• හොඳ මුදලක ලක්ෂණ පැහැදිලි කරයි.<br>• මුදලේ කාර්යයන් නිදසුන් සහිතව පැහැදිලි කරයි.<br>• මුදල් වර්ගවල විශේෂ ලක්ෂණ ඉදිරිපත් කරමින් ඒවාට නිදසුන් සපයයි. | 08 |
| | 7.2 මුදලට ඉල්ලුමක් ඇති වීමට බලපාන හේතු සහ මුදල් ඉල්ලුම තීරණය කරනු ලබන සාධක විමසා බලයි. | • මුදල් ඉල්ලුම (ද්‍රවශීලතා වරණය )<br>• අර්ථ දැක්වීම.<br>• මුදලට ඉල්ලුමක් ඇති වීමට හේතු<br>• ගනුදෙනු චේතනාව<br>• ආරක්ෂණ චේතනාව<br>• සමපේක්ෂණ චේතනාව<br>• මුදල් ඉල්ලුම තීරණය කරන සාධක | • මුදල් ඉල්ලුම අර්ථකථනය කරයි.<br>• මුදලට ඉල්ලුමක් ඇති වීමට හේතු ඉදිරිපත් කරයි.<br>• මුදලට ඉල්ලුමක් ඇති වීමට හේතු ප්‍රස්තාර සටහන් භාවිත කරමින් විග්‍රහ කරයි.<br>• මුදලට ඇති ඉල්ලුම තීරණය කරන සාධක විග්‍රහ කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 මුදල් සැපයුම විශ්ලේෂණාත්මක ව ඉදිරිපත් කරයි. | • මුදල් සැපයුම<br>• අර්ථ දැක්වීම<br>• මුදල් සැපයුම පිළිබඳ නිර්වචන<br>• $M_1$ පටු මුදල් සැපයුම<br>• $M_2$ පුළුල් මුදල් සැපයුම<br>• $M_{2b}$ ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම<br>• $M_4$ පුළුල් මුදල් සැපයුම<br>(සංඛ්‍යා දත්ත පිළිබඳ දැනුම අපේක්ෂා නොකරේ. )<br>• පදනම් මුදල්<br>• සංරචක හා තීරක<br>• මුදල් ගුණකය<br>• පදනම් මුදල් හා මුදල් ගුණකය අතර ඇති සම්බන්ධතාව | • මුදල් සැපයුම අර්ථ දක්වයි.<br>• මුදල් සැපයුමේ නිර්වචන අනුපිළිවෙළින් පෙළගස්වයි.<br>• මුදල් සැපයුමේ නිර්වචන විග්‍රහ කරයි.<br>• මුදල් සැපයුම තීරණය කරන සාධක ඉදිරිපත් කරයි.<br>• පදනම් මුදල් තීරණය කරන සාධක විග්‍රහ කරයි.<br>• මහ බැංකු වත්කම් හා වගකීම් ඇසුරෙන් පදනම් මුදල් විග්‍රහ කරයි.<br>• මුදල් ගුණකය අර්ථකථනය කරයි.<br>• මුදල් ගුණකය හා පදනම් මුදල් අතර සම්බන්ධතාව සමීකරණ භාවිතයෙන් විග්‍රහ කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.4 මිල මට්ටම ආශ්‍රිත සංකල්ප, න්‍යාය සහ මිනුම් විශ්ලේෂණය කරයි. | • මිල මට්ටම ආශ්‍රිත සංකල්ප<br>• උද්ධමනය<br>• අවධමනය<br>• නිරුද්ධමනය<br>• උද්ධමනයේ න්‍යායාත්මක ප්‍රවේශ<br>• ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය<br>• මුදල් ප්‍රමාණවාදය<br>• කේන්සියානු න්‍යාය<br>• පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනය<br>• උද්ධමනයේ ප්‍රතිවිපාක<br>• ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටම<br>• මිල දර්ශක හැඳින්වීම<br>• ශ්‍රී ලංකාවේ දැනට භාවිත කරන මිල දර්ශක | • මිල මට්ටම අර්ථ දක්වයි.<br>• මිල මට්ටම් ආශ්‍රිත සංකල්ප පැහැදිලි කරයි.<br>• උද්ධමනයට බලපාන හේතු විවිධ ප්‍රවේශ ඔස්සේ විග්‍රහ කරයි.<br>• උද්ධමනයේ ප්‍රතිවිපාක විග්‍රහ කරයි.<br>• උද්ධමනය පාලනය කිරිමට යොදා ගත හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස් වීම මැනීමට යොදා ගන්නා මිල දර්ශක හඳුන්වයි.<br>• මිල දර්ශක ඇසුරෙන් ශ්‍රී ලංකාවේ මිල මට්ටම් ආශ්‍රිත ප්‍රවණතා පරීක්ෂා කර බලයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.5 ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කාර්යභාරය විමසයි. | • ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය<br>• අර්ථ දැක්වීම<br>• සංරචක<br>• මූල්‍ය ආයතන<br>• මූල්‍ය වෙළෙඳපොළ<br>• මූල්‍ය උපකරණ<br>• මූල්‍ය යටිතල පහසුකම්<br>• මූල්‍ය ආයතන අධීක්ෂණය කරන නියාමන ආයතන | • මූල්‍ය පද්ධතිය අර්ථ දක්වයි.<br>• ශ්‍රී ලංකා මූල්‍ය පද්ධතියේ සංරචක නම් කරයි. | 08 |
| | 7.6 ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්ය විමසයි. | • මහ බැංකුව<br>• අරමුණු<br>• කාර්යයන්<br>• මූල්‍ය ප්‍රතිපත්ති<br>• මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ | • ශ්‍රී ලංකා මහ බැංකුව අර්ථ දක්වයි.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු විග්‍රහ කරයි.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය ගෙනහැර දක්වයි.<br>• මූල්‍ය ප්‍රතිපත්තිය අර්ථ දක්වයි.<br>• මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ නම් කරමින් විග්‍රහ කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.7 වාණිජ බැංකුවක කාර්යභාරය විමසයි. | • වාණිජ බැංකු<br>• හැඳින්වීම<br>• අරමුණු<br>• කාර්යයන්<br>• ශේෂ පත්‍රය<br>• මුදල් මැවීම | • වාණිජ බැංකුවක් යන්න අර්ථ දක්වයි.<br>• වාණිජ බැංකුවල ප්‍රධාන අරමුණු පැහැදිලි කරයි.<br>• වාණිජ බැංකුවල අරමුණු ඉටුකර ගැනීමට යාමේ දී මුහුණ දෙන ගැටලු පැහැදිලි කරයි.<br>• වාණිජ බැංකුවක කාර්ය විස්තර කරයි.<br>• වාණිජ බැංකුවක ශේෂ පත්‍රය දක්වයි.<br>• වාණිජ බැංකුවක වත්කම් ව්‍යුහය හඳුන්වයි.<br>• වාණිජ බැංකු මුදල් මැවීම සිදු කරන ආකාරය ශේෂ පත්‍රයක් ඇසුරෙන් ඉදිරිපත් කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8. සාර්ව ආර්ථික අරමුණු ළඟාකර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි. | | | | 65 |
| | 8.1 වෙළෙඳපොළ අසමත් වීමට හේතු විමර්ශනය කරයි. | • වෙළෙඳපොළ අසමත් වීම<br>• හැඳින්වීම<br>• හේතු<br>• සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාව<br>• පොදු භාණ්ඩ නොසැපයීම<br>• බාහිරතා සැලකිල්ලට නොගැනීම<br>• අපූර්ණ තරගය හා ඒකාධිකාරීත්වය<br>• අපූර්ණ තොරතුරු<br>• පොදු සම්පත් අධි භාවිතය<br>• සුභ සාධන භාණ්ඩ ප්‍රශස්ත ව නොසැපයීම<br>• අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත ව පරිභෝජනය නොවීම<br>• සමාජයට අහිතකර භාණ්ඩ සැපයීම<br>• සාර්ව ආර්ථික අස්ථායිතාව<br>• ආදායම බෙදී යෑමේ විෂමතාව | • වෙළෙඳපොළ (ක්‍රමය) අසමත් වීම යන්න අර්ථකථනය කරයි.<br>• වෙළෙඳපොළ (ක්‍රමය) අසමත් වීමට බලපාන හේතු පැහැදිලි කරයි.<br>• සම්පත් බෙදී යෑමේ අකාර්යක්ෂමතා පැහැදිලි කරයි.<br>• සාර්ව ආර්ථික අස්ථායිතාව පැහැදිලි කරයි.<br>• ආදායම බෙදී යෑමේ විෂමතාව පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 වෙළෙඳපොළ අසාර්ථක වීම කෙරෙහි බාහිරතාවල බලපෑම් පරීක්ෂා කරයි. | • බාහිරතා<br>• අර්ථ දැක්වීම<br>• නිෂ්පාදනයේ බාහිරතා<br>• පරිභෝජනයේ බාහිරතා<br>• බාහිරතා නිසා වෙළෙඳපොළ අසාර්ථක වීම<br>• බාහිරතා හමුවේ වෙළෙඳපොළ අසාර්ථක වීම වළක්වාලීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග | • බාහිරතා නිර්වචනය කරයි.<br>• බාහිරතා උපදවන මූලාශ්‍රය නම් කරයි.<br>• බාහිරතා උපදවන ධනාත්මක හා සෘණාත්මක මූලාශ්‍රය වෙන් වෙන් ව දක්වා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• බාහිරතා නිසා වෙළෙඳපොළ අසාර්ථක වන අයුරු ප්‍රස්තාර සටහන් යොදා ගනිමින් පැහැදිලි කරයි.<br>• බාහිරතා හේතුවෙන් වෙළෙඳපොළ අසාර්ථක වීම වළක්වාලීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි. | 07 |
| | 8.3 වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය විමර්ශනය කරයි. | • වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය<br>• සම්පත් කාර්යක්ෂම ව බෙදා හැරීම<br>• ආදායම හා ධනය සාධාරණ වෙන් කිරීම බෙදා හැරීම<br>• සාර්ව ආර්ථික ස්ථායිතාව<br>• තිරසර සංවර්ධනය<br>• නියාමනය<br>• ආණ්ඩුවේ අසමත් වීම<br>• අර්ථ දැක්වීම<br>• හේතු | • වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය හඳුන්වයි.<br>• වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය නිදසුන් සපයමින් පැහැදිලි කරයි.<br>• වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය ඉටු කිරීමට යාමේ දී ආණ්ඩුව අසාර්ථක වන ආකාරය විස්තර කරයි.<br>• ආණ්ඩුව අසාර්ථක වීමට හේතු ඉදිරිපත් කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.4 බදු මූලධර්ම හා බදු වර්ගීකරණය පිළිබඳ විමර්ශනය කරමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරය විශ්ලේෂණය කරයි. | • රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය<br>  • අර්ථ දැක්වීම<br>  • අරමුණු<br>• රාජ්‍ය අයභාරය<br>  • බදු අයභාරය<br>    • බදු අය කිරීමේ අරමුණු<br>    • බදු මූලධර්ම<br>    • බදු වර්ග කිරීම<br>    • බදු විතැන් කිරීම හා බදු ආපාතය<br>    • බදු ක්‍රමයක ආර්ථික ප්‍රතිවිපාක<br>• බදු නොවන රාජ්‍ය අයභාරය<br>• ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරයේ මෑතකාලීන උපනති | • රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අර්ථ දක්වයි.<br>• රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ අරමුණු පැහැදිලි කරයි.<br>• රාජ්‍ය මූල්‍ය උපකරණ නම් කරයි.<br>• රාජ්‍ය අයභාරයේ ප්‍රධාන මූලාශ්‍රය නම් කරයි.<br>• බදු අය කිරීමේ අරමුණු පැහැදිලි කරයි.<br>• බදු මූලධර්ම විස්තර කරයි.<br>• විවිධ නිර්ණායක මත බදු වර්ගීකරණය කරයි.<br>• බදු විතැන් කිරීම හා බදු ආපාතය යන සංකල්ප පැහැදිලි කරයි.<br>• බදු අය කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක සොයා බලයි.<br>• බදු නොවන අයභාරයට අයත් සංරචක පෙන්වා දෙයි.<br>• ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරයේ මෑතකාලීන උපනති පරීක්ෂා කරයි. (මහ බැංකු වාර්තා ඇසුරෙන් ) | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.5 රාජ්‍ය වියදමේ සංයුතිය හා කාලීන උපනති විග්‍රහ කරයි. | • රාජ්‍ය වියදම<br>• රාජ්‍ය වියදම් හට ගැනීමට හේතු<br>• රාජ්‍ය වියදම් වර්ගීකරණය<br>• ආර්ථික වර්ගීකරණය<br>• රාජ්‍ය වියදමේ මෑත කාලීන උපනති | • රාජ්‍ය වියදම් හටගැනීමට හේතු පැහැදිලි කරයි.<br>• රාජ්‍ය වියදම ආර්ථික පදනම මත වර්ගීකරණය කරයි.<br>• ආර්ථික වර්ගීකරණයෙහි ඒ ඒ සංරචක පැහැදිලි කරයි.<br>• රාජ්‍ය වියදමේ සංයුතිය හා එහි උපනති පරීක්ෂා කර බලයි.<br>• රාජ්‍ය වියදම්වල ප්‍රතිවිපාක විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.6 රාජ්‍ය අයවැය ලේඛනයක ස්වරූපය හා අයවැය ප්‍රතිපත්ති විශ්ලේෂණය කරයි. | • ශ්‍රී ලංකා රජයේ අයවැය ලේඛනය<br>• අර්ථ දැක්වීම<br>• හිඟ, අතිරික්ත හා තුලිත අයවැය<br>• ආකෘතිය<br>• වර්තන ගිණුමේ ශේෂය<br>• ප්‍රාථමික ගිණුමේ ශේෂය<br>• සමස්ත ගිණුමේ ශේෂය<br>• ශුද්ධ මුල්‍ය හිඟය<br>• රාජ්‍ය අයවැය ප්‍රතිපත්ති<br>• ප්‍රසාරණාත්මක අයවැය ප්‍රතිපත්ති<br>• සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්ති<br>• රාජ්‍ය අයවැය ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක | • රාජ්‍ය අය වැය ලේඛනය අර්ථ දක්වයි.<br>• හිඟ, අතිරික්ත හා තුලිත අයවැය ඉදිරිපත් කරයි.<br>• රාජ්‍ය අය වැය ලේඛනයක ආකෘතිය ඉදිරිපත් කරයි.<br>• වර්තන ගිණුමේ අතිරික්තයක වැදගත්කම විස්තර කරයි.<br>• ප්‍රාථමික ගිණුමේ ශේෂය පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකා රජයේ ශුද්ධ මුල්‍ය හිඟය හා සමස්ත ශේෂය අතර වෙනස පැහැදිලි කරයි.<br>• ප්‍රසාරණාත්මක රාජ්‍ය අය වැය ප්‍රතිපත්ති විස්තර කරයි.<br>• සංකෝචනාත්මක රාජ්‍ය අය වැය ප්‍රතිපත්ති විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 8.7 රාජ්‍ය අය වැය හිඟය පියවීම හා රාජ්‍ය ණයෙහි සංයුතිය විමසයි. | • රාජ්‍ය අය වැය හිඟය පියවීම<br>• දේශීය මූලාශ්‍රය හා ප්‍රතිවිපාක<br>• විදේශීය මූලාශ්‍රය හා ප්‍රතිවිපාක<br>• ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය<br>• සංයුතිය<br>• ප්‍රතිවිපාක | • අය වැය හිඟය පියවීම සඳහා යොදා ගන්නා මූලාශ්‍රය වෙන් කර ඉදිරිපත් කරයි.<br>• අය වැය හිඟය පියවීමේ දේශීය හා විදේශීය මූලාශ්‍රයවල ප්‍රතිවිපාක විස්තර කරයි.<br>• රාජ්‍ය ණය සංයුතිය ඉදිරිපත් කරයි.<br>• ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණයවල උපනති මහ බැංකු මූලාශ්‍රය දත්ත මගින් ඉදිරිපත් කරයි.<br>• දේශීය ණය මූලාශ්‍රය මගින් ණය ලබා ගැනීමේ දී ඇති වන ගැටලු විස්තර කරයි.<br>• රාජ්‍ය ණය ඉහළ යෑමේ ආර්ථික ප්‍රතිවිපාක විමසා බලයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 8.8 සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාව ඇසුරෙන් විමසීමට ලක් කරයි. | • සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්ති<br>• හැඳින්වීම<br>• ශ්‍රී ලංකාවේ ක්‍රියාමාර්ග<br>• ආර්ථික ප්‍රතිවිපාක | • සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්ති අර්ථ දක්වයි.<br>• සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්තිවල උපකරණ නම් කරයි.<br>• ශ්‍රී ලංකාවේ සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්ති යොදාගන්නා ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.<br>• සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක විමසා බලයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9. විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේෂණය කරයි. | 9.1 අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වු සාධක විමර්ශනය කරයි. | • අන්තර්ජාතික වෙළෙඳාම<br>• අර්ථ දැක්වීම<br>• අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වු න්‍යාය<br>• නිරපේක්ෂ වාසි න්‍යාය<br>• සාපේක්ෂ වාසි න්‍යාය<br>• සාපේක්ෂ වාසි න්‍යාය පදනම් වන උපකල්පන<br>• අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය<br>• බාහිර හුවමාරු අනුපාතිකය<br>• සාපේක්ෂ වාසි හටගන්නා මුලාශ්‍ර<br>• තරගකාරිත්වයේ වාසි<br>• අන්තර්ජාතික වෙළෙඳාමේ වාසි<br>• ස්ථිතික වාසි<br>• ගතික වාසි | • අන්තර්ජාතික වෙළෙඳාම අර්ථ දක්වයි.<br>• අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වු නිරපේක්ෂ වාසි න්‍යාය අර්ථ දක්වයි.<br>• ඒ ඒ රටට නිරපේක්ෂ වාසි ලැබෙන ආකාරය සංඛ්‍යා නිදසුන් මගින් පැහැදිලි කරයි.<br>• නිරපේක්ෂ වාසි හට ගැනීමට හේතු දක්වයි.<br>• අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වු සාපේක්ෂ වාසි න්‍යාය අර්ථ දක්වයි.<br>• සාපේක්ෂ වාසි න්‍යාය පදනම් වන උපකල්පන දක්වයි.<br>• සංඛ්‍යා නිදසුන් යොදා ගනිමින් සාපේක්ෂ වාසි ලැබෙන ආකාරය පැහැදිලි කරයි.<br>• අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය පැහැදිලි කරයි.<br>• අන්තර්ජාතික වෙළෙඳාමට ප්‍රවේශ වීම සඳහා අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායී බාහිර හුවමාරු අනුපාතය ගණනය කරයි.<br>• සාපේක්ෂ වාසි හට ගන්නා මුලාශ්‍ර (හේතු) සඳහන් කරයි.<br>• තරගකාරිත්වයේ වාසිය අන්තර්ජාතික වෙළෙඳාමට බලපාන ආකාරය පැහැදිලි කරයි.<br>• අන්තර්ජාතික වෙළෙඳාමේ දී ඇති වන ස්ථිතික වාසි හා ගතික වාසි පැහැදිලි කරයි. | 40<br>10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 9.2 ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග හා එමගින් නිදහස් වෙළෙඳාමට ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි. | • ආරක්ෂණවාදය<br>• අර්ථ දැක්වීම<br>• ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග<br>• තීරු බදු<br>• නාමික ආරක්ෂණය<br>• සඵල ආරක්ෂණය<br>• තීරු බදු නොවන වෙළෙඳ බාධක.<br>• ආරක්ෂණවාදයට පක්ෂ ව හා විපක්ෂ ව ඉදිරිපත් වී ඇති තර්ක | • ආරක්ෂණවාදය අර්ථ දක්වයි.<br>• ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග වෙන් කර දක්වයි.<br>• තීරු බදු ආරක්ෂණය පැහැදිලි කරයි.<br>• නාමික ආරක්ෂණ අනුපාතිකය හා සඵල ආරක්ෂණ අනුපාතිකය පැහැදිලි කරයි.<br>• තීරු බදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග සඳහන් කරයි.<br>• ආරක්ෂණවාදයට පක්ෂ ව හා විපක්ෂ ව ඇති තර්ක ඉදිරිපත් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.3 විදේශ වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දක්වමින් ඒවායේ වෙනස්වීම්වලට හේතු හා ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි. | • වෙළෙඳ අනුපාතිකය<br>• භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය<br>• අර්ථ දැක්වීම<br>• ගණනය කිරීම<br>• වෙනස්වීම් හා ඊට හේතු<br>• ප්‍රතිවිපාක<br>• ආදායම් වෙළෙඳ අනුපාතිකය<br>• අර්ථ දැක්වීම<br>• ගණනය කිරීම<br>• ප්‍රතිවිපාක | • වෙළෙඳ අනුපාතිකය අර්ථ දක්වයි.<br>• වෙළෙඳ අනුපාතිකයේ විවිධ ප්‍රභේද නම් කරයි.<br>• භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය සමීකරණය මගින් ප්‍රකාශ කරයි.<br>• දෙන ලද දත්ත මගින් භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ගණනය කරයි.<br>• භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස්වීම්වලට හේතු පැහැදිලි කරයි.<br>• භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස්වීම්වල ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.<br>• ආදායම් වෙළෙඳ අනුපාතිකය සමීකරණ මගින් ප්‍රකාශ කරයි.<br>• දෙන ලද දත්ත මගින් ආදායම් වෙළෙඳ අනුපාතිකය ගණනය කරයි.<br>• ආදායම් වෙළෙඳ අනුපාතිකයේ ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.4 ගෝලීයකරණය, කලාපීයකරණය හා ද්වී පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් විමසයි. | • ලෝක වෙළෙඳ සංවිධානය (WTO)<br>  • අරමුණු<br>  • කාර්යයන්<br>• ගෝලීයකරණය<br>  • අර්ථ දැක්වීම<br>  • පක්ෂ ව හා විපක්ෂ ව ඉදිරිපත් වී ඇති තර්ක<br>• ආර්ථික ඒකාබද්ධ වීම්<br>• වෙළෙඳ ගිවිසුම්<br>  • ද්වී පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්<br>    • වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළත්ව සිටින වෙළෙඳ ගිවිසුම්<br>  • බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්<br>    • වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළත්ව සිටින වෙළෙඳ ගිවිසුම් | • ලෝක වෙළෙඳ සංවිධානයේ අරමුණු පැහැදිලි කරයි.<br>• ලෝක වෙළෙඳ සංවිධානයේ කාර්යයන් විස්තර කරයි.<br>• ගෝලීයකරණය අර්ථ දක්වයි.<br>• ගෝලීයකරණයට පක්ෂව හා විපක්ෂව ඉදිරිපත් වී ඇති තර්ක ඉදිරිපත් කරයි.<br>• ආර්ථික ඒකාබද්ධ වීම් අර්ථ දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ මෑත කාලීන වෙළෙඳ ගිවිසුම් විස්තර කරයි.<br>• විදේශ වෙළෙඳ ගිවිසුම්වල ඇති වැදගත්කම විස්තර කරයි.<br>• ද්වී පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් දක්වයි.<br>• බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් දක්වයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.5 ශ්‍රී ලංකා විදේශ වෙළෙඳාමේ ස්වභාවය හා විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති විමර්ශනය කරයි. | • ශ්‍රී ලංකාවේ අපනයන<br>• අපනයන ව්‍යුහය<br>• උපනති<br><br>• ශ්‍රී ලංකාවේ ආනයන<br>• ආනයන ව්‍යුහය<br>• උපනති<br>• විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති<br>• වර්තමාන විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති<br>• අපනයන වෙළෙඳාම මුහුණපාන ගැටලු හා විසඳුම් | • ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳාම විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ ආනයන වෙළෙඳාම විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහය මහ බැංකු වාර්තා දත්ත අනුව විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ ආනයන උපනති මහ බැංකු වාර්තා දත්ත අනුව පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති (කාලීන තොරතුරු ඇසුරෙන්) විස්තර කරයි.<br>• අපනයන වෙළෙඳාමේ දී මුහුණපාන ගැටලු විස්තර කරයි.<br>• අපනයන වෙළෙඳාම මුහුණ දෙන ගැටලු සහ ඒවාට විසඳුම් ඉදිරිපත් කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10. විදේශ මූල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි. | | | | 45 |
| | 10.1 ගෙවුම් ශේෂ ලේඛනයේ අන්තර්ගතය විශ්ලේෂණය කරයි. | • ගෙවුම් ශේෂ ලේඛනය<br>• අර්ථ දැක්වීම<br>• සංරචක<br>• ජංගම ගිණුම<br>• ප්‍රාග්ධන ගිණුම<br>• මූල්‍ය ගිණුම | • ගෙවුම් ශේෂ ලේඛනය අර්ථ දක්වයි.<br>• ගෙවුම් ශේෂ ලේඛනයේ සංරචක නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• කල්පිත සංඛ්‍යා ඇසුරෙන් ගෙවුම් ශේෂ ලේඛනයක් පිළියෙල කරයි.<br>• මහ බැංකු වාර්තාව ඇසුරෙන් ගෙවුම් ශේෂ ලේඛනයේ කාලීන ආකෘතිය ඉදිරිපත් කරයි. | 05 |
| | 10.2 ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ අසමතුලිතතා හඳුනා ගනිමින් ඒ සඳහා විසඳුම් හා ක්‍රියාමාර්ග යෝජනා කරයි. | • ශ්‍රී ලංකා ගෙවුම් ශේෂ ලේඛනයේ වර්තමාන උපනති<br>• ජංගම ගිණුමේ හිඟය<br>• ගෙවුම් ශේෂ අසමතුලිතතා සඳහා විසඳුම්<br>• කෙටි කාලීන<br>• දිගු කාලීන | • ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ඇසුරෙන් ගෙවුම් ශේෂ ලේඛනයේ උපනති පැහැදිලි කරයි.<br>• ජංගම ගිණුමේ හිඟය පැහැදිලි කරයි.<br>• ගෙවුම් තුලනයේ අසමතුලිතතාව නිවැරිදි කිරීමට කෙටි කාලීන විසඳුම් යෝජනා කරයි.<br>• ගෙවුම් තුලන ලේඛනයක හිඟයක් අඛණ්ඩ ව පවතී නම් එයට දිගු කාලීන විසඳුම් යෝජනා කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.3 විදේශ සම්පත් පරතරය හා විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව වෙනස් වූ ආකාරය විශ්ලේෂණය කරයි. | • විදේශ සම්පත් පරතරය<br>• අර්ථ දැක්වීම හා ගණනය කිරීම<br>• මෑත කාලීන උපනතින්<br>• පිය වූ ආකාරය හා ඒවායේ ප්‍රතිවිපාක<br>• විදේශ සම්පත් පරතරයේ සාපේක්ෂ ප්‍රමාණය මැනීම<br>• විදේශ වත්කම්<br>• අර්ථ දැක්වීම<br>• සංයුතිය<br>• වැදගත්කම<br>• සාපේක්ෂ ප්‍රමාණය මැනීම හා ප්‍රමාණය<br>• විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව | • විදේශ සම්පත් පරතරය අර්ථ දක්වයි.<br>• කල්පිත සංඛ්‍යා ඇසුරෙන් විදේශ සම්පත් පරතරය ගණනය කරයි.<br>• මෑත කාලයේ විදේශ සම්පත් පරතරය පිය වූ ආකාරය මහ බැංකු වාර්තාව ඇසුරින් පැහැදිලි කරයි.<br>• විදේශ වත්කම් අර්ථ දක්වයි.<br>• විදේශ වත්කම්වල සංයුතිය දක්වයි.<br>• විදේශ වත්කම් පවත්වා ගැනීම රටකට වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.<br>• විදේශ වත්කම්වල සාපේක්ෂ ප්‍රමාණය මැනීම හා එහි මෑතකාලීන ප්‍රමාණය මහ බැංකු වාර්තාව ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව කොපමණ කාලයකට ප්‍රමාණවත් වේ ද යන්න ප්‍රකාශ කරයි. | 06 |
| | 10.4 විදේශ ආයෝජන රටක ආර්ථිකයට බලපාන ආකාරය විමසයි. | • විදේශ ආයෝජන වර්ග<br>• සෘජු ආයෝජන<br>• හැඳින්වීම<br>• ප්‍රවණතා<br>• කළඹ ආයෝජනය<br>• හැඳින්වීම<br>• ප්‍රවණතා | • විදේශ ආයෝජනය අර්ථ දක්වයි.<br>• විදේශ ආයෝජනය වර්ගීකරණය කරයි.<br>• සෘජු ආයෝජනය හඳුන්වා මෑත කාලීන ප්‍රවණතා දක්වයි.<br>• සෘජු ආයෝජනයේ හිතකර හා අහිතකර ප්‍රතිවිපාක විග්‍රහ කරයි.<br>• කළඹ ආයෝජනය හඳුන්වා එහි මෑත කාලීන ප්‍රවණතා විග්‍රහ කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.5 විදේශ විනිමය අනුපාතිකය තීරණය වන ආකාරය විශ්ලේෂණය කරයි. | • විදේශ විනිමය වෙළෙඳපොළ<br>• අර්ථ දැක්වීම<br>• විදේශ විනිමය අනුපාතිකය<br>• අර්ථ දැක්වීම<br>• ඍජු කියවීම<br>• වක්‍ර කියවීම<br>• විදේශ විනිමය අනුපාතික තීරණය වීම<br>• විදේශ විනිමය ඉල්ලුම<br>• විදේශ විනිමය සැපයුම | • විදේශ විනිමය වෙළෙඳපොළ අර්ථ දක්වයි.<br>• විදේශ විනිමය අනුපාතිකය අර්ථ දක්වයි.<br>• විදේශ විනිමය අනුපාතික ක්‍රම තීරණය වන ආකාරය පැහැදිලි කරයි. | 04 |
| | 10.6 විදේශ විනිමය අනුපාතික ක්‍රම තුලනාත්මක ව විග්‍රහ කරයි. | • විදේශ විනිමය අනුපාතික ක්‍රම<br>• ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය<br>• හැඳින්වීම<br>• වාසි /අවාසි<br>• නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය<br>• හැඳින්වීම<br>• වාසි /අවාසි<br>• පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය<br>• හැඳින්වීම<br>• නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• මූර්ත විනිමය අනුපාතිකය<br>• අර්ථ දැක්වීම හා සූත්‍රය<br>• ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය<br>• අර්ථ දැක්වීම<br>• සූත්‍රය සහ වැදගත්කම | • ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය හඳුන්වා එම ක්‍රමයේ වාසි අවාසි දක්වයි.<br>• නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය හඳුන්වා එම ක්‍රමයේ වාසි අවාසි දක්වයි.<br>• පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය හඳුන්වයි.<br>• නාමික සඵල විනිමය අනුපාතිකය හා මූර්ත සඵල විනිමය අනුපාතිකය අතර වෙනස පැහැදිලි කරයි.<br>• මූර්ත විනිමය අනුපාතිකය අර්ථ දක්වා එය ගණනය කරන ආකාරය පැහැදිලි කරයි.<br>• ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය අර්ථ දක්වයි.<br>• ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය නිදසුන් යොදා ගෙන පැහැදිලි කරයි.<br>• ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකයේ වැදගත්කම පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.7 විනිමය අනුපාතිකය වෙනස් වීම් හා එහි ප්‍රතිවිපාක විග්‍රහ කරයි. | • විදේශ විනිමය අනුපාතිකය වෙනස් වීම<br>• අවප්‍රමාණය හා ක්ෂය වීම<br>• අර්ථ දැක්වීම<br>• ප්‍රතිවිපාක<br>• ප්‍රතිප්‍රමාණය හා අගය ඉහළ යෑම<br>• අර්ථ දැක්වීම<br>• ප්‍රතිවිපාක<br>• අවප්‍රමාණයේ හෝ මුදලේ විදේශ අගය ක්ෂයවීමේ අපේක්ෂිත ඉලක්ක ඉටුවීමට තිබිය යුතු කොන්දේසි | • විනිමය අනුපාතිකය වෙනස් වන ආකාරය දක්වයි.<br>• විනිමය අනුපාතිකය අවප්‍රමාණය සහ ක්ෂයවිම අර්ථ දක්වයි.<br>• අවප්‍රමාණයේ ප්‍රතිවිපාක නිදසුන් ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය සහ අගය ඉහළ යාම අර්ථ දක්වයි.<br>• ප්‍රතිප්‍රමාණයක ප්‍රතිවිපාක නිදසුන් ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• මුදල් අවප්‍රමාණයේ අපේක්ෂිත ඉලක්ක ඉටුවීමට තිබිය යුතු කොන්දේසි පැහැදිලි කරයි. | 06 |
| | 10.8 බහු-පාර්ශ්වීය මුල්‍ය ආයතනවල කාර්යයන් විමසයි. | • බහු-පාර්ශ්වීය මුල්‍ය ආයතන<br>• අන්තර්ජාතික මුල්‍ය අරමුදල (IMF)<br>• අරමුණු<br>• කාර්යයන්<br>• ලෝක බැංකුව (IBRD)<br>• අරමුණු<br>• කාර්යයන් | • බහු-පාර්ශ්වීය මුල්‍ය ආයතන නම් කරයි.<br>• අන්තර්ජාතික මුල්‍ය අරමුදලේ අරමුණු දක්වයි.<br>• අන්තර්ජාතික මුල්‍ය අරමුදලේ කාර්යයන් විස්තර කරයි.<br>• ලෝක බැංකුවේ අරමුණු දක්වයි.<br>• ලෝක බැංකුවේ කාර්යයන් විස්තර කරයි.<br>• ලෝක බැංකුවේ කාලීන වෙනස්කම් විමසයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11. සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි. | | | | 70 |
| | 11.1 ආර්ථික වෘද්ධියේ වැදගත්කම අගය කරමින් ආර්ථික වර්ධනයට ඉවහල් වන සාධක විශ්ලේෂණය කරයි. | • ආර්ථික වර්ධනය<br>• අර්ථ දැක්වීම<br>• මැනීම<br>• තීරණය වන සාධක<br>• වැදගත්කම<br>• පිරිවැය<br>• ආර්ථික වෘද්ධිය හා සම්බන්ධ නව සංකල්ප<br>• ශ්‍රී ලංකාවේ මෑත කාලීන වෘද්ධි ප්‍රවණතා<br>• වෘද්ධි ක්‍රියාවලිය ජයගත් රටවල පොදු ලක්ෂණ | • ආර්ථික වෘද්ධිය අර්ථකථනය කරයි.<br>• ආර්ථික වෘද්ධිය මැනීම සිදු කරන ආකාරය විස්තර කරයි.<br>• ආර්ථික වෘද්ධිය තීරණය වන සාධක පෙන්වා දෙයි.<br>• ආර්ථික වෘද්ධියේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ආර්ථික වෘද්ධියේ පිරිවැයක් පවතින බව නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික වෘද්ධි ප්‍රවණතා පැහැදිලි කරයි.<br>• වෘද්ධි ක්‍රියාවලිය ජයගත් රටවල පොදු ලක්ෂණ විග්‍රහ කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.2 සංවර්ධනය ආශ්‍රිත විවිධ සංකල්ප විග්‍රහ කරයි. | • ආර්ථික සංවර්ධනය<br>  • අර්ථ දැක්වීම<br>  • ආර්ථික සංවර්ධනයත් සමඟ ආර්ථික ව්‍යුහයේ ඇති වන වෙනස් වීම්<br>• සංවර්ධනය<br>  • අර්ථ දැක්වීම<br>  • සංවර්ධනයේ පැතිකඩ<br>• මානව සංවර්ධනය<br>  • අර්ථ දැක්වීම<br>  • පැතිකඩ<br>• තිරසර සංවර්ධනය<br>  • අර්ථ දැක්වීම<br>  • පැතිකඩ<br>• සංවර්ධනය ආශ්‍රිත නව ප්‍රවණතා | • ආර්ථික සංවර්ධනය අර්ථ දක්වයි.<br>• ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක දී ආර්ථික ව්‍යුහයේ ඇති වන වෙනස් වීම් විස්තර කරයි.<br>• සංවර්ධනය සංකල්පය අර්ථ දක්වයි.<br>• සංවර්ධනයේ පැතිකඩ විග්‍රහ කරයි.<br>• ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය අතර වෙනස සසඳයි.<br>• මානව සංවර්ධනයේ පැතිකඩ විස්තර කරයි.<br>• මානව සංවර්ධනය අර්ථ දක්වයි.<br>• මානව සංවර්ධනයේ පැතිකඩ විග්‍රහ කරයි.<br>• තිරසර සංවර්ධනය අර්ථ දක්වයි.<br>• තිරසර සංවර්ධනයේ පැතිකඩ විග්‍රහ කරයි.<br>• සංවර්ධනය ආශ්‍රිත නව ප්‍රවණතා විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.3 සංවර්ධනය මිනුම් කිරීමේ දර්ශක පෙළගස්වමින් සංයුක්ත දර්ශක පිළිබඳ ව විමර්ශනය කරයි. | • සංවර්ධනය මිනුම් කිරීමේ දර්ශක<br>• ප්‍රතිශීර්ෂ ආදායම<br>• ආංශික මිනුම්<br>• ලෝක බැංකු ආර්ථික වර්ගීකරණය<br>• සංයුක්ත දර්ශක<br>• මානව සංවර්ධන දර්ශකය<br>• සංතුෂ්ටි දර්ශකය | • සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශක පෙළ ගස්වයි.<br>• සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශකවල වැදගත්කම හා අඩුපාඩු අනාවරණය කරයි.<br>• ප්‍රතිශීර්ෂ ආදායම පදනමක් ලෙස යොදා ගෙන ලෝක බැංකුව ආර්ථික වර්ගීකරණය කරන ආකාරය ඉදිරිපත් කරයි.<br>• සංවර්ධනය මැනීම සඳහා සංයුක්ත දර්ශක නම් කරයි.<br>• මානව සංවර්ධන දර්ශකය හඳුන්වයි.<br>• මානව සංවර්ධන දර්ශකය සකස් කිරීමට යොදා ගැනෙන සංරචක නම් කරයි.<br>• මානව සංවර්ධන දර්ශකය මත පිහිටා රටවල් වර්ග කරන ආකාරය දක්වයි.<br>• මානව සංවර්ධන දර්ශකයෙහි ප්‍රබලතා හා දුබලතා පෙන්වා දෙයි.<br>• මානව සංවර්ධනයෙහිලා ශ්‍රී ලංකාව අත්පත් කරගත් ප්‍රගතිය අනාවරණය කරයි.<br>• සංතුෂ්ටි දර්ශකය හඳුන්වයි.<br>• එහි සංරචක විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.4 ආදායම් විෂමතාව මැනීමට යොදා ගන්නා සම්මත ක්‍රම පරීක්ෂා කරයි. | • ආදායම් ව්‍යාප්ති විෂමතාව<br>  • අර්ථ දැක්වීම<br>• නිරපේක්ෂ ආදායම් සහ සාපේක්ෂ ආදායම් ව්‍යාප්ති විෂමතාව<br>• කුටුම්බ ආදායම් සහ වියදම් ව්‍යාප්තිය<br>• ආදායම් විෂමතාව මනින මිනුම්<br>  • ලෝරන්ස් වක්‍රය<br>  • ගිනි සංගුණකය<br>  • පංචමක අපකිරණ අනුපාතිකය | • ආදායම් ව්‍යාප්ති විෂමතාව අර්ථ දක්වයි.<br>• නිරපේක්ෂ ආදායම් සහ සාපේක්ෂ ආදායම් ව්‍යාප්ති විෂමතාව අර්ථ දක්වමින් පැහැදිලි කරයි.<br>• ආදායම් විෂමතාව මැනීමට යොදා ගන්නා විවිධ මිනුම් පැහැදිලි කරයි.<br>• ලෝරන්ස් වක්‍රය නිර්මාණය කරයි.<br>• ගිනි සංගුණකය ගණනය කරයි.<br>• පංචමක අපකිරණ අනුපාතිකය විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.5 දරිද්‍රතා සංකල්පය විග්‍රහ කරමින් එය මිනුම් කරන අයුරු දක්වයි. | • දරිද්‍රතා සංකල්පය<br>• අර්ථ දැක්වීම<br>• දරිද්‍රතාව මැනීම<br>• ජාතික දරිද්‍රතා ඉම<br>• ජනගහන දරිද්‍රතා දර්ශකය<br>• ජාත්‍යන්තර දරිද්‍රතා ඉම<br>• වෙනත් දරිද්‍රතා දර්ශක<br>• දරිද්‍රතාවේ ස්වරූප<br>• නිරපේක්ෂ දරිද්‍රතාව<br>• සාපේක්ෂ දරිද්‍රතාව<br>• පැතිකඩ<br>• පාරිභෝජන දරිද්‍රතාව (ආදායම්)<br>• මානව දරිද්‍රතාව | • දරිද්‍රතා සංකල්පය නිර්වචනය කරයි.<br>• දරිද්‍රතාව මැනීමේ විවිධ මිනුම් නම් කරයි.<br>• ජාතික දරිද්‍රතා ඉම පැහැදිලි කරයි.<br>• ජනගහන දරිද්‍රතා දර්ශකය පැහැදිලි කරයි.<br>• ජාත්‍යන්තර දරිද්‍රතා ඉම පැහැදිලි කරයි.<br>• දරිද්‍රතාව මනින මිනුම් ආශ්‍රයෙන් රටවල් අතර දරිද්‍රතාව තුලනාත්මක ව විග්‍රහ කරයි.<br>• දරිද්‍රතාවේ ස්වරූප දෙක හඳුන්වා දෙයි.<br>• දරිද්‍රතාවේ පැතිකඩ දෙක පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 11.6 ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව විමර්ශනයට ලක් කරයි. | • ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව<br>• ජාතික දරිද්‍රතා මට්ටම<br>• ප්‍රාදේශීය සහ ආංශික වෙනස්කම්<br>• දරිද්‍රතාවට හේතු<br>• දරිද්‍රතාව අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග | • ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම හඳුන්වයි.<br>• ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ ප්‍රාදේශීය වෙනස්කම්වලට හේතු ඉදිරිපත් කරයි.<br>• ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවට හේතු වූ කරුණු ඉදිරිපත් කරයි.<br>• ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අවම කරන ක්‍රියාමාර්ග යෝජනා කරයි. | 06 |
| | 11.7 ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යාප්තියේ වෙනස්වීම් සහ එහි ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි. | • ජනගහනය<br>• ජනගහන වර්ධනය හා එහි තීරක<br>• ස්වාභාවික වර්ධනය<br>• ශුද්ධ සංක්‍රමණ<br>• ජනගහන ව්‍යාප්තියේ වෙනස් වීම් සහ ප්‍රතිවිපාක | • ජනගහන වර්ධනය හා එහි තීරක හඳුන්වයි.<br>• ජනගහනයේ ස්වාභාවික වර්ධන අනුපාතය හා ශුද්ධ සංක්‍රමණ අනුපාතය ගණනය කරයි.<br>• ජනගහන ව්‍යාප්තියේ වෙනස්වීම් හා එහි ආර්ථික ප්‍රතිවිපාක විග්‍රහ කරයි.<br>• වයස් ව්‍යුහයේ ඇති වන වෙනස්වීම් නිසා ඇති වන ප්‍රතිවිපාක විමර්ශනය කරයි.<br>• ශ්‍රී ලංකාවේ ජනගහනයේ ආංශික ව්‍යාප්තිය පැහැදිලි කරයි.<br>• ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්ති අර්ථ දක්වමින් පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාත අර්ථ දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාතය ගණනය කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.8 ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය හා එය ගණනය කරන ආකාරය විග්‍රහ කරයි. | • ශ්‍රම බලකාය<br>• අර්ථ දැක්වීම<br>• ගණනය කිරීම<br>• වැඩ කළ හැකි වයසේ ජනගහනය<br>• ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය<br>• ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ලාක්ෂණික | • ශ්‍රම බලකාය අර්ථ දක්වයි.<br>• කල්පිත සංඛ්‍යා දත්ත භාවිත කරමින් ශ්‍රම බලකාය ගණනය කරයි.<br>• වැඩ කළ හැකි වයසේ ජනගහනය හා ශ්‍රම බලකාය අතර වෙනස පැහැදිලි කරයි.<br>• ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය ගණනය කරයි.<br>• ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ලාක්ෂණික පැහැදිලි කරයි. | 08 |
| | 11.9 ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ හා සේවා වියුක්තියේ ව්‍යුහාත්මක ලක්ෂණ විමසා බලයි. | • සේවා නියුක්තිය<br>• අර්ථ දැක්වීම<br>• ව්‍යුහය<br>• සේවා නියුක්ති අනුපාතිකය<br>• ඌන සේවා නියුක්තිය<br>• අර්ථ දැක්වීම<br>• හේතු<br>• ප්‍රතිවිපාක<br>• සේවා වියුක්තිය<br>• අර්ථ දැක්වීම<br>• හේතු<br>• ප්‍රතිවිපාක | • සේවා නියුක්තිය අර්ථ දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියෙහි ලක්ෂණ දක්වයි.<br>• සේවා නියුක්ති අනුපාතිකය ගණනය කරයි.<br>• ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති අනුපාතිකය හා වෙනස් වීම් විමර්ශනය කරයි.<br>• ඌන සේවා නියුක්තිය අර්ථ දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ ඌන සේවා නියුක්තියට හේතු හා එහි ප්‍රතිවිපාක පෙන්වා දෙයි.<br>• සේවා වියුක්තිය අර්ථ දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතිකය හා එහි වෙනස් වීම් පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියට හේතු පෙන්වා දෙයි.<br>• සේවා වියුක්තියේ සමාජ ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 12.ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය සහ ප්‍රතිපත්ති පිළිබඳ ව තුලනාත්මක ව විමර්ශනය කරයි. | 12.1 නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ හටගත් වෙනස්කම් විමර්ශනය කරයි. | • නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ හටගත් වෙනස්වීම්<br>• ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්කම්<br>• ආනයන ආදේශන හා කාර්මික ප්‍රතිපත්ති<br>• හැඳින්වීම<br>• ලක්ෂණ<br>• ප්‍රතිවිපාක<br>• අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිය<br>• හැඳින්වීම<br>• ලක්ෂණ<br>• ප්‍රතිවිපාක | • නිදහසින් පසු ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් විස්තර කරයි.<br>• ආනයන ආදේශන ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ නම් කරයි.<br>• කාර්මීකරණ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ විස්තර කරයි.<br>• ආනයන ආදේශන ප්‍රතිපත්ති ආර්ථිකයට බලපාන ආකාරය විස්තර කරයි.<br>• කාර්මීකරණ ප්‍රතිපත්ති ආර්ථිකයට බලපාන ආකාරය විස්තර කරයි.<br>• අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිය අර්ථකථනය කරයි.<br>• අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ විස්තර කරයි.<br>• අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්ති මගින් ආර්ථිකයට වූ බලපෑම විමර්ශනය කරයි. | 20<br>08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.2 ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා ගවේෂණය කරයි. | • ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා<br>• ආර්ථික ව්‍යුහයේ හටගෙන ඇති වෙනස්වීම්<br>• නිෂ්පාදනය<br>• සේවා නියුක්තිය<br>• විදේශ සේවා නියුක්තිය හා ප්‍රේෂණ<br>• යටිතල පහසුකම් සංවර්ධනය<br>• සංචාරක කර්මාන්තය<br>• දැනුම් ආර්ථිකය<br>• ප්‍රාදේශීය සංවර්ධනය | • කාලීන දත්ත ඇසුරෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ ව්‍යුහමය වෙනස්කම් විස්තර කරයි.<br>• ආර්ථිකයේ සේවා නියුක්තිය, විදේශ සේවා නියුක්තිය හා ප්‍රේෂණ, යටිතල පහසුකම් සංවර්ධනය, සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳව කාලීන දත්ත ඇසුරෙන් විග්‍රහ කරයි.<br>• සේවා නියුක්තිය ඉහළ යෑමට හෝ පහළ යෑමට හෝ හේතු වූ සාධක විස්තර කරයි.<br>• සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා විශ්ලේෂණය කරයි.<br>• ප්‍රාදේශීය සංවර්ධනයේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ආර්ථිකයේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා ඇති වීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.3 සමකාලීන ආර්ථික සිදුවීම සහ ප්‍රතිපත්ති විමර්ශනය කරයි. | • සමකාලීන ආර්ථික සිදුවීම්<br>  • දේශීය<br>    • ආර්ථික අභියෝග සහ ගැටලු<br>  • ගෝලීය<br>• සමකාලීන ආර්ථික ප්‍රතිපත්ති | • ආර්ථිකයට දේශීය හා ගෝලීය සිදුවීම් බලපාන ආකාරය විස්තර කරයි.<br>• දේශීය හා ගෝලීය ආර්ථික සිද්ධිවලට නිදසුන් දක්වයි.<br>• දේශීය හා ගෝලීය ආර්ථික සිද්ධි ඇතිවීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.<br>• සමකාලීන ආර්ථික ප්‍රතිපත්ති විස්තර කරයි. | 04<br><br>300 |

# 7.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

ආර්ථික විද්‍යාව විෂය නිර්දේශය නිපුණතා 12 කින් හා නිපුණතා මට්ටම් 83 කින් සමන්විත ය. මෙම සියලු නිපුණතා හා නිපුණතා මට්ටම් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් මගින් ශිෂ්‍යයා වෙත පවරාදීම අපේක්ෂා කෙරේ. සෑම නිපුණතා මට්ටමක් යටතේ ම, එම නිපුණතා මට්ටම අවසානයේ දී ශිෂ්‍යයා තුළ සාක්ෂාත් විය යුතු ඉගෙනුම් පල වෙන වෙන ම දක්වා ඇත.

පාසල් කාල සටහනේ සාමාන්‍යයෙන් වර්ෂයකට මෙම විෂය සඳහා කාලච්ඡේද 420 වෙන් කෙරෙන එහෙත් මෙම විෂය නිර්දේශය වසරකට කාලච්ඡේද 300 ක් සඳහා පමණක් සැලසුම් කර ඇත. ඒ අනුව 12 හා 13 ශ්‍රේණි සඳහා කාලච්ඡේද 600 ක් වෙනුවෙන් සමස්ත විෂය නිර්දේශය සකස් කර ඇත. ඒ අනුව මෙම විෂය නිර්දේශය සකස් කර ඇත්තේ වර්ෂයකට නියමිත කාලච්ඡේද සංඛ්‍යාවට වඩා අඩු කාලච්ඡේද සංඛ්‍යාවක් ඇතුළත් වන පරිදි ය. මෙම අමතර කාලච්ඡේද පාසල පදනම් කර ගත් තක්සේරුකරණය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ය. ඒ මගින් ශිෂ්‍යයින්ට තම ඉගෙනුම් අත්දැකීම් තවදුරටත් පෝෂණය කර ගැනීමට අවස්ථාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එක් එක් නිපුණතා මට්ටම යටතේ දැක්වෙන ඉගෙනුම් පල කරා ළඟා වීමේ දී ප්‍රායෝගික අත්දැකීම් පදනම් කරගෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ සංකල්ප සාධනය කෙරෙන ආකාරයට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම අපේක්ෂා කෙරේ. ආර්ථික විද්‍යාව විෂය සඳහා යොදා ගත හැකි විවිධ ක්‍රමෝපාය සැලකිල්ලට ගත් විට ප්‍රායෝගික නැඹුරුව ඇති විෂය සමගාමී වැඩසටහන් සහ විෂයානුබද්ධ පාසල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. එමගින් ශිෂ්‍යයාගේ සහජ දක්ෂතා ඉස්මතු කර ගැනීමට සහ නිර්මාණශීලී චින්තනයට ඉඩකඩ සලසා දිය යුතු ය. මේ සඳහා පාසල තුළ පහසුවෙන් යොදා ගත හැකි පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් කීහිපයක් පහත දැක්වේ.

- ආර්ථික විද්‍යානුකූල ව සිතීමට ශිෂ්‍යයන් හුරු කිරීම
- වෙළෙඳපොළක් සංවිධානය කර පැවැත්වීම මගින් වෙළෙඳපොළ බලවේග ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීම
- ආර්ථික විද්‍යාව විෂයට අදාළ සමාජයේ අත්දැකීම් පන්ති කාමරයට ගෙන ඒම සඳහා සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම
- ආර්ථික විද්‍යාව විෂයට යෝග්‍ය සරල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කොට වාර්තාවක් සකස් කිරීම
- ආර්ථික විද්‍යාව සංගමයක් හෝ සමිතියක් ආරම්භ කර පවත්වාගෙන යෑම
- ආර්ථික විද්‍යා දිනයක් පැවැත්වීම
- ආර්ථික මධ්‍යස්ථාන, කොටස් වෙළෙඳපොළ වැනි ස්ථාන නිරීක්ෂණය කොට අධ්‍යයනය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම
- මිනිසා ආර්ථික විද්‍යාත්මක ව හැසිරීම තහවුරු කිරීම සඳහා සුදුසු නාට්‍ය නිර්මාණය හා රඟ දැක්වීම
- විෂයට අදාළ ව පුවත්පත්වල සහ සඟරාවල පළවන ලිපි එකතුවක් පවත්වාගෙන යෑම

- ආර්ථික විද්‍යාවට අදාළ විශ්වීය ප්‍රවණතා අළලා බිත්ති පුවත්පතක් හා සඟරාවක් පවත්වාගෙන යෑමට ශිෂ්‍යයන් යොමු කිරීම
- පාසල් ආපන ශාලාව, පාසල් සමූපකාර සමිතිය, පාසල් බැංකුව පවත්වාගෙන යෑම සඳහා ආර්ථික විද්‍යාව විෂය හදාරණ ශිෂ්‍යයන් යොමු කිරීම
- තරග, සංවාද, විවාද හා සම්මන්ත්‍රණ පැවැත්වීම
- අන්තර්ජාලය භාවිතයෙන් ආර්ථික විද්‍යාවට අදාළ ව ලෝකයේ ප්‍රවණතා හඳුනා ගැනීමට යොමු කිරීම
- ආර්ථික විද්‍යාවට අදාළ ව පරිසරයේ කාලීන සිදුවීම් පිළිබඳ ව දැනුවත් කිරීම

ඉහත සඳහන් ආකාරයේ ආර්ථික විද්‍යාව විෂයට සුවිශේෂී වූ ක්‍රියාකාරකම් හා වැඩසටහන් පාසල තුළ ක්‍රියාත්මක කිරීම මගින් මෙම විෂය වඩාත් ප්‍රායෝගික වූ විෂයක් ලෙස ශිෂ්‍යයන්ට හා පාසල් ප්‍රජාව අතට පත් කිරීම අවශ්‍ය වේ. මේ සඳහා පාසලට සුවිශේෂී වූ ප්‍රතිපත්තියක් ගොඩනගා ක්‍රියාත්මක කිරීමට අ.පො.ස. (උසස් පෙළ ) ආර්ථික විද්‍යාව විෂය හදාරන සිසුන්ගෙන් සහ එම විෂය උගන්වන ගුරුවරුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා ගැනීම යෝග්‍ය යැයි යෝජනා කෙරේ. එම කමිටුව විසින් උසස් පෙළ ආර්ථික විද්‍යා විෂයයට සමගාමී ව ක්‍රියාකාරකම් කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ප්‍රතිපත්ති තීරණය කර පාසලේ වාර්ෂික වැඩසටහන සමඟ ඒකාබද්ධ කිරීම වඩා සුදුසු ය. මේ සෑම අවස්ථාවක දී ම අධ්‍යාපනයේ සැබෑ ගනුදෙනුකරුවන් වන දරුවන්ගේ සහ දෙමාපියන්ගේ අවශ්‍යතා ද, රාජ්‍ය ප්‍රතිපත්ති ද පදනම් කර ගත යුතු ය. එමෙන් ම අදාළ සම්පත්, අරමුදල්, පාසල් හා ප්‍රජාව අතර සම්බන්ධය ද මනාව අධ්‍යයනයට භාජනය කිරීම අවශ්‍ය ය.

# 8.0 තක්සේරුව හා ඇගැයීම

පාසල පදනම් කර ගත් ඇගැයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි පාසල පදනම් කරගත් තක්සේරුකරණය සඳහා සුදුසු උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරිම අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගැයීම වන අ.පො.ස. (උසස් පෙළ ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය. මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමුවරට 2019 වර්ෂයේ දී පැවැත්වේ. මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.